දේශීය ආදායම්
ã óåè ì ì ¹ é÷ôõ
INLAND REVENUE

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ආදායම් වාර්තාව සහ එහි උපලේඛන පිරවීම සඳහා උපදෙස්

# වාසික පුද්ගලයෝ

# 2008/2009 තක්සේරු වර්ෂය

**මෙම උපදෙස්වල අරමුණ** - මෙම උපදෙස් මාලාවෙන් අපේක්ෂා කෙරෙන්නේ ඉහත තක්සේරු වර්ෂය සඳහා ඔබගේ ආදායම් වාර්තාව හා එහි උපලේඛන සම්පූර්ණ කිරීමේදී සහ ආදායම් බද්ද ගණනය කිරීමේදී ඔබට සහාය වීමය.

ඔබ හට තවදුරටත් යම් සහායක් අවශ්‍ය වන්නේ නම් ඔබගේ ආදායම් බදු ලිපිගොනුව පිළිබඳව කටයුතු කරන තක්සේරුකරු හෝ ඔබට ළඟම පිහිටි මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක තක්සේරුකරුවෙකුගෙන් හෝ විමසන්න.

**මෙම උපදෙස් සකසා ඇති ක්‍රමය** - වාර්තාව සමග පුරවා එවිය යුතු උපලේඛන එකොළහක්ද ඔබගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමට ආකෘති පත්‍රයක්ද වාර්තාව සමගින් ඇත. (ඔබ වෙත තබා ගැනීමට ගණන් බැලීමේ පත්‍රිකාවක් නොමැති අතර, වාර්තාවේ සහ උපලේඛනවල ඡායා පිටපතක් ඔබගේ පිටපත ලෙස තබා ගැනීමට කටයුතු කරන ලෙස කරුණාවෙන් දන්වනු ලැබේ). **ඔබගේ කැමැත්ත පරිදි තෝරා ගත් භාෂාවෙන් වාර්තාව එවා ඇත.**

වාර්තාවේ එක් එක් ශීර්ෂයන්ට සහ අදාල උපලේඛනයන්ට අනුරූප පැහැදිලි කිරීම් මෙහි එම අංකයන් යටතේම දක්වා ඇත. සපයා ඇති උපලේඛනවල අදාල විස්තර දැක්වීමට ප්‍රමාණවත් ඉඩ නොමැති නම් අමතර කඩදාසියක් පාවිච්චි කරන්න.

**කලත්‍රයා හෝ දරුවා -**

(අ) විවාහක සහකරුවා (කලත්‍රයා) බදු අයකිරීමේ කාර්යයන් සඳහා වෙනම පුද්ගලයෙකු ලෙස සලකනු ලැබේ. **<u>ඒ අනුව ඔහු/ඇය සිය අදායම් පිළිබඳ වාර්තාව වෙනම ඉදිරිපත් කළ යුතු වේ.</u>**

(ආ) වාසික පුද්ගලයෙකුගේ වයස අවුරුදු 18 ට අඩු අවිවාහක දරුවකුගේ ආදායම, දෙමව්පියන්ගේ විවාහය පවතී නම්, පියාගේ ආදායමට එකතු කරනු ලැබේ. විවාහය නොපවතී නම් දරුවා නඩත්තු කරන සහ ඔහු/ඇය ජීවත් වන්නේ කා සමගද එකී මවගේ හෝ පියාගේ ආදායමට දරුවාගේ ආදායම එකතු කරනු ලැබේ. ඔබ එකී මව හෝ පියා වේ නම් එම දරුවාගේ ආදායම ඔබේ වාර්තාවට ඇතුලත් කරන්න. (එම එකතු කිරීම නිර්වාසික දෙමාපියන්ට අදාල නොවේ).

(ඇ) ඔබගේ කලත්‍රයාට හෝ වයස අවුරුදු 18 ට වැඩි අවිවාහක දරුවෙකුට 2008.04.01 සිට 2009.03.31 දක්වා කාලයේදී රු.300,000 කට වැඩි ආදායමක් තිබුණේ නම් ඔබගේ ආදායම් බදු ලිපිගොනුව පවත්නා අංශයේ/ කාර්යාලයේ නියෝජ්‍ය කොමසාරිස්ගෙන් අවශ්‍ය ආකෘති පත්‍ර ලබා ගෙන වෙනම වාර්තා සපයන ලෙස ඔහුට/ඇයට දන්වන්න.

**බදු නිදහස් සීමාව -** ඔබගේ තක්සේරු කළ හැකි ආදායම රු.300,000 නොඉක්මවන්නේ නම් ඔබ ආදායම් බද්දට යටත් නොවේ. කෙසේ නමුත් තැන්පතු මත යම් පොලියක් හෝ සමාගම් කොටස් මත ලාභාංශයක් රඳවා ගැනීමේ (අවසාන) බද්දකට යටත් විය හැක.

**වාර්තාව සහ සනාථ කෙරෙන ලියවිලි** - ආදායම් බද්ද පවත්නා වර්ෂ පදනම මත ගෙවිය යුතුය. 2008.04.01 සිට 2009.03.31 දක්වා කාලය සඳහා අදාල ආදායම් පිළිබඳ විස්තර මෙහි ප්‍රකාශ කළ යුතුය. ගිණුම් ප්‍රකාශද, සුදුසුකම් ලබන ගෙවීම් සනාථ කිරීමට ලියකියවිලිද ප්‍රභවයේදී ගෙවූ බදු සනාථ කිරීමට රඳවා ගැනීමේ බදු සහතිකද, උපයන විට ගෙවීමේ T-10 සහතිකද, ස්වතක්සේරු බදු ගෙවීම් පිළිබඳ ගෙවීම් පත්‍රිකා පිටපත් ද වාර්තාවට ඇමිණිය යුතුය.
වාර්තාවේ අවසාන පිටුවේ අදාල කොටුවේ ඔබගේ **ජාතික හැඳුනුම්පත් අංකය** සඳහන් කල යුතුය.

ආදායම් වාර්තා ආකෘති පත්‍රය නියමිත ලෙස සම්පූර්ණ කොට උපලේඛනද සමග <u>2009 නොවැම්බර් 30 දින</u> හෝ ඊට පෙර ලැබෙන පරිදි ඔබගේ ආදායම් බදු ලිපිගොනුව පිළිබඳව කටයුතු කරන අංශයට / ප්‍රාදේශීය කාර්යාලයට තැපැල් කල / භාරදිය යුතුය.

**නියමිත දින වන විට වාර්තාව සැපයීමට අපොහොසත් වන හෝ වැරදි වාර්තාවක් සපයන ඕනෑම තැනැත්තකු මත දණ්ඩන පැනවීමට නීතියෙන් විධි විධාන සලසා ඇත.**

## 1 වැනි කොටස

## බද්දට යටත් වන ලාභ සහ ආදායම් ප්‍රකාශය

01. **සේවා නියුක්ති ආදායම** (1 වැනි උපලේඛනය)

(1) බද්දට යටත් ආදායම - පහත සඳහන් ලැබීම් සේවා නියුක්ති ආදායමට ඇතුලත් වේ.

(අ) **මුදලින් ලැබෙන ප්‍රතිලාභ -**

- යම් වේතන, වැටුප්, ප්‍රසාද මුදල්, කොමිස් මුදල්, නිවාඩු වැටුප්, අතිකාල ගෙවීම්, ගාස්තු, පාරිතෝෂික, අමතර ලැබීම්, දීමනා හෝ සේවයේ නියුක්ත වී සිටියදී ලැබෙන වෙනත් යම් ගෙවීමක්, හෝ විශ්‍රාම වැටුපක්.
- විශ්‍රාම ගැනීමට පෙර අනුමත අර්ථසාධක අරමුදලකින් ආපසු ලබාගත් මුදල්.
- යම් සංග්‍රහ දීමනාවක්, ගමන් වියදම් දීමනාවක් හෝ වෙනත් යම් දීමනාවක්.
- නීත්‍යානුකූල හෝ නොවූ තෑගි මුදල්, තුටු පඬුරු හෝ එබඳු යම් ලැබීම්.
- වාහනයක් මිලදී ගැනීම සඳහා දෙන ලද යම් දීමනාවක්.

(ආ) **මුදලින් නොවන ප්‍රතිලාභ -**

- ඔබ හෝ ඔබ පවුලේ යම් සාමාජිකයෙකු විසින් නොමිලේ ලබන වෛද්‍ය පහසුකම්, ඉන්ධන, විදුලිය යනාදියෙහි වටිනාකම.
- ඔබගේ හෝ ඔබ පවුලේ අර්ථලාභය පිණිස වෙනත් තැනැත්තෙකුට සේවා යෝජකයා විසින් ගෙවන යම් මුදලක්. (උදා - ආදායම් බදු, ජීවිත රක්ෂණ වාරික, මෙහෙකරු වේතන ආදිය)
- නොමිලේ ලැබෙන ප්‍රවාහන පහසුකම්වල වටිනාකම. (ඔබගේ පෞද්ගලික ගමන් සඳහා සේවා යෝජකයාට අයත් මෝටර් රථයක් ඔබ පාවිච්චි කරන්නේ නම් හෝ ඔබගේ මෝටර් රථයේ ඉන්ධන වියදම් ආදිය සේවා යෝජකයා විසින් දරන්නේ නම් සේවා ආදායමයට එකතු කලයුතු ප්‍රතිලාභයේ වටිනාකම සඳහා කරුණාකර අංක 1479/6 හා 2007 ජනවාරි 09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය බලන්න). කෙසේ වුවද සේවා නියුක්තිකයෙකුට ඔහුගේ නිවස සහ සේවා ස්ථානය අතර ගමන් කිරීම

පිණිස සේවා යෝජකයෙකු විසින් මෝටර් කෝච් රථයකින් නොමිලයේ සපයන ප්‍රවාහන පහසුකමේ වටිනාකම බද්දට යටත් නොවේ.

- ඔබට හෝ ඔබගේ පවුලේ අයට ලබා දෙන ලද නිවාඩු ගමන් බලපත්‍රවල වටිනාකම.
- සේවා යෝජකයා විසින් කුලී රහිතව හෝ අඩු කුලියට සපයා ඇති නිල නිවාසයක කුලී වටිනාකම හෝ එම නිල නිවාසයේ කුලී වටිනාකම ඔබ ගෙවන කුලියට වඩා වැඩිනම් එම අතිරික්ත කුලී වටිනාකම, මෙහි කුලී වටිනාකම යන්න ඔබගේ අනෙකුත් සේවා නියුක්ති ආදායම (සේවාන්ත ප්‍රතිලාභ ආදිය හැර) රු.1,800,000 නොඉක්මවන්නේ නම් රු.120,000 ක උපරිම සීමාවකට යටත් වන අතර, ඔබගේ එකී අනෙකුත් සේවා නියුක්ති ආදායම රු.1,800,000 ඉක්මවන්නේ නම් රු.180,000/- උපරිම සීමාවකට යටත් වේ.

<u>කුලී වටිනාකම</u>

නිවාසයක කුලී වටිනාකම යනු එහි වරිපනම් තක්සේරුවට වර්ෂය සඳහා වූ වරිපනම් එකතු කල විට ලැබෙන අගය හෝ එම නිවෙස සඳහා අයිතිකරුට ගෙවූ දළ කුලිය යන දෙකින් වැඩි වටිනාකම වේ.

**මුදල්මය ප්‍රතිලාභ සහ මුදල්මය නොවන ප්‍රතිලාභවල මුළු එකතුව උපලේඛන 1 හි 103 කොටුවෙහි සඳහන් කරන්න.**

(ඇ) එක් වතාවක් පමණක් කරන ගෙවීම් (සේවාන්ත ප්‍රතිලාභ) - (උපලේඛන 1 හි 104 කොටුව)

- විශ්‍රාම පාරිතෝෂිකය.
- පරිවර්තිත විශ්‍රාම වැටුප.
- තනතුරු අහිමිවීම වෙනුවෙන් වන්දි.
- විශ්‍රාම ගැනීමේදී අනුමත අර්ථසාධක අරමුදලකින් හෝ පරිපාලිත අර්ථසාධක අරමුදලින් ගෙවූ මුදල්.
- සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලින් ගෙවූ මුදල්.

(2) රජයේ සේවා නියුක්තිකයන් මත ආදායම් බද්ද:

- ඒකාබද්ධ අරමුදලෙහි වැය ප්‍රතිපාදන මගින් හෝ පලාත් අරමුදල් මගින් ගෙවීම් කරනු ලබන රාජ්‍ය ආයතනයක හෝ වෙනත් ආයතනයක සේවා නියුක්තිකයින් සේවා නියුක්ති ආදායමද ඇතුළුව මුළු ව්‍යවස්ථාපිත ආදායම මත බද්දට යටත් වන අතර, සාමාන්‍ය නීති යටතේ බදු ආගණනය සිදු කෙරේ.
- මුළු ව්‍යවස්ථාපිත ආදායමට නිල පාරිශ්‍රමිකයන්ගේ අනුපාතය මත බදු බැරක් ලබා දේ. (යම් විශ්‍රාම වැටුපක්, ප්‍රසාද දීමනාවක්, දිරි දීමනාවක්, තිළිණ මුලක්, දඩ මුදලක කොටසක් හෝ ඒ හා සමාන ගෙවීමක් හැර)
- සේවා යෝජකයාගෙන් බදු අඩු කිරීමක් සිදු නොකරන අතර, සේවා නියුක්තිකයා විසින් ස්වයං තක්සේරු පදනම මත බදු ගෙවිය යුතු වේ.

02. <u>වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තීය හෝ රක්ෂාවෙන් ලැබෙන ලාභය (2 වැනි උපලේඛනය)</u>

බදු කාර්යය සඳහා ගලපන ලද ආදායම උපලේඛන 2 හි අවසාන කොටුවේ සඳහන් කරන්න. බදු කාර්යය සඳහා ගලපන ලද ආදායම යනු (දේශීය ආදායම් පනතේ විධි විධානවලට අනුව අඩු කළ නොහැකි වියදම් හැර) ආදායමක් උපයා ගැනීමට දරන ලද සියළු වියදම් අඩු කිරීමෙන් පසුව ලැබෙන ශුද්ධ ආදායමයි.

වෙළඳාමේ, වෘත්තියේ, ව්‍යාපාරයේ හෝ රක්ෂාවේ නම, ස්වභාවය හා ලිපිනය සඳහන් කරන්න. ගිණුම් ප්‍රකාශ සහ බදු ආගණනය අමුණන්න.

**<u>කොටස් විකිණීම:-</u>**

අදාල ගණුදෙනුව සම්බන්ධයෙන් " කොටස් ගණුදෙනු බද්ද " ගෙවා ඇත්නම්, කොටස් විකිණීමෙන් ලැබෙන යම් ලාභයක් ආදායම් බද්දෙන් නිදහස් වේ.

***වෙළඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ලැබෙන මුළු ආදායමේ එකතුව (උපලේඛනයේ 111 කොටුව) වාර්තාවේ 110 කොටුවේ ප්‍රකාශ කල යුතුය. ගලපන ලද ශුද්ධ ආදායමෙන් අලාභයක් වන විට එය උපලේඛන 8 හි සටහන් කරන්න.***

වෙළඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ලැබෙන බදු කටයුතු සඳහා ගලපන ලද ශුද්ධ ආදායම එසේ ගණනය කිරීමේදී ආදායම ඉපැයීම සඳහා යොදා ගත් අදාල වත්කම් අත්පත් කර ගැනීම සඳහා දැරූ පිරිවැය මත සෘජු රේඛීය ක්‍රමය මත පදනම් වූ ක්ෂය දීමනාවක් අඩු කල හැකිය. එවැනි ප්‍රාග්ධන හෝ ක්ෂයවීම් දීමනා සඳහා අනුප්‍රමාණයන් පහත දැක්වේ.

(i) (අ) පිරියත, යන්ත්‍ර හෝ සවි කිරීම් වන (විපයාංක (ii) හෝ (iii) හි සඳහන් දැ නොවන)

| | |
|---|---|
| - සෞඛ්‍යාරක්ෂාව සැපයීම, කඩදාසි මත මුද්‍රණය කිරීම, මැණික් කැපීම සහ ඔප දැමීම, වාණිජ කටයුතු සඳහා යම් වෙළඳ ද්‍රව්‍යයක් ඇසුරුම් කිරීම, සහල් කෙටීම යන යම් ව්‍යාපාරයක 2006.04.01 දින හෝ ඉන්පසුව අත්පත් කරගෙන පාවිච්චි කරන එකී යම් පිරියත, යන්ත්‍ර හෝ සවි කිරීම් අත්පත් කර ගැනීමේ පිරිවැය මත. | 33 1/3% බැගින් |
| - 2007.04.01 දින හෝ ඉන්පසුව නැවක් අත්පත් කර ගැනීමේ පිරිවැය මත | 33 1/3% බැගින් |
| - ඉදිකිරීම් කටයුතු කරගෙන යන ව්‍යාපාරයක 2007.04.01 දින හෝ ඉන්පසුව අත්පත් කරගෙන භාවිතා කරන යන්ත්‍ර හෝ පිරියත අත්පත් කර ගැනීමේ පිරිවැය මත | 25% බැගින් |
| - 2004.04.01 දින හෝ ඉන්පසුව අත්පත් කරගෙන පාවිච්චි කරන ලද - පිරියත, යන්ත්‍ර හෝ සවි කිරීම් අත්පත් කර ගැනීමේ පිරිවැය මත | 12 1/2% බැගින් |
| (ආ) අත්පත් කරගෙන පාවිච්චි කරන ලද පරිගණක මෘදුකාංග හෝ පරිගණක දෘඩාංග - ශ්‍රී ලංකාවේදී නිර්මාණය කරන ලදුව 2008.04.01 වැනි දින හෝ ඉන්පසුව අත්පත් කර ගත්තේ නම් අත්පත් කර ගැනීමේ පිරිවැය මත | 100% බැගින් |
| - 2005.04.01 දින හෝ එදිනට පසුව අත්පත් කර ගත් උපකරණ කොටස් හා පරිගණක මෘදුකාංග ඇතුළු තොරතුරු තාක්ෂණ උපකරණ ගණන්බැලීමේ උපකරණ එම උපකරණ කොටස් සහ පරිගණක මෘදුකාංග අත්කර ගැනීමේ පිරිවැය මත | 25% බැගින් |

| | | |
|---|---|---|
| (ii) | ලොරියක්, බස් රථයක්, ට්‍රැක්ටරයක් හෝ ට්‍රේලරයක් වැනි යම් මෝටර් වාහනයක් හෝ යම් කාර්යාලීය ගෘහ භාණ්ඩ 2004.04.01 දින හෝ ඉන්පසුව අත්පත් කරගෙන පාවිච්චි කරන ලද්දේ නම් අත්පත් කර ගැනීමේ පිරිවැය මත | 20% බැගින් |
| (iii) | යම් ස්පර්ශ කළ නොහැකි වත්කම් (කීර්තිනාමය හැර) 2004.04.01 දින හෝ ඉන් පසුව අත්පත් කර ගන්නා ලද්දේ නම් අත්පත් කර ගැනීමේ පිරිවැය මත | 10% බැගින් |
| (iv) (අ) | 2004.04.01 දින හෝ ඊට පසු ඉදි කරන ලද හෝ අත්පත් කර ගන්නා ලද යම් පාලමක්, දුම්රිය මාර්ගයක්, ජලාශයක්, විදුලි බලය හෝ ජලය බෙදා හැරීමේ මාර්ගයක් හෝ ගාස්තු අය කෙරෙන මාර්ග මත | 6 2/3% බැගින් |
| (ආ) | යම් සුදුසුකම් ලබන ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ පිරිවැය මත, වාණිජ්‍ය කටයුතු සඳහා පාවිච්චි කිරීමට අත්පත් කර ගන්නා ලද සහාධිපත්‍ය දේපළ ඒකකයක් අත්පත් කර ගැනීමේ පිරිවැය මත හෝ (1993.04.01 දිනට පෙර ඉදි කළ හෝ අත්පත් කර ගත් එවැනි ගොඩනැගිල්ලක් හෝ ඒකකයක් හැර) හෝටල් ගොඩනැගිල්ලක් හෝ හෝටල් ගොඩනැගිලි සංකීර්ණයක්, කර්මාන්ත ගොඩනැගිල්ලක් හෝ කර්මාන්ත ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම හෝ අත්පත් කර ගැනීමේ පිරිවැය මත (2004.04.01 දින හෝ ඉන්පසුව ඉදි කරන ලද හෝ යම් තැනැත්තෙකු විසින් වෙළඳ ව්‍යාපාර කටයුතු සඳහා පාවිච්චි කරන ලද ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි සංකීර්ණයක් එවැනි තැනැත්තෙකුගෙන් අත්පත් කර ගන්නා ලද) | 6 2/3% බැගින් |
| (ඇ) | යම් නිෂ්පාදන ක්‍රියාවලියක් සම්බන්ධයෙන් සිය නමින් බලපත්‍ර ලබා ගැනීම සඳහා කරන ලද ගෙවීමක් මත | |
| | - 1999.04.01 දින හෝ ඊට පසු එහෙත් 2002.04.01 දිනට පෙර ගෙවීම මත | 10% බැගින් |
| | - 2005.04.01 දින හෝ ඊට පසුව ගෙවීම් මත | 25% බැගින් |

**සටහන -** ඉහත යම් ඡේදයක් යටතේ අඩු කිරීම්වලට ඉඩ දෙනු ලබන්නේ, අත්පත් කර ගත් හෝ ඉදි කිරීමේ දිනයට අනුව අඩුකිරීම්වල මුළු එකතුව එකී වත්කම අත්පත් කර ගැනීමේ හෝ ඉදි කිරීමේ පිරිවැය නොඉක්මවන්නේ නම් පමණයි.

## 03. කුලී සහ / හෝ ශුද්ධ වාර්ෂික වටිනාකම (3 වැනි උපලේඛනය)

(i) **කුලිය -** නිවාසයක් කුලියට දී ඇති අවස්ථාවකදී ප්‍රකාශ කළ යුතු කුලී ආදායම වන්නේ, දළ කුලී ආදායමෙන් වරිපනම් අඩුකර අයිතිකරු විසින් අළුත්වැඩියා සඳහා වියදම් දරනු ලබන්නේ නම්

ශේෂයෙන් 25% කට සමාන ප්‍රමාණයක් (එවැනි අළුත්වැඩියා සහ වෙනත් වියදම් සඳහා දීමනාවක් වශයෙන්) අඩු කිරීමෙන් පසුව වන කුලී ආදායම වේ. වෙනත් අඩු කිරීම් සඳහා ඉඩ දෙනු නොලැබේ. බදු කාර්යය සඳහා වන කුලී ආදායම ගණනය කිරීම පහත දැක්වෙන උදාහරණයේ පරිදි වේ.

උදා: මාසික කුලිය රු.6,000/- , වරිපනම් තක්සේරුව රු.30,000 (වරිපනම් 25%)

| | (රුපියල්) |
|---|---|
| වර්ෂය සඳහා දළ කුලිය (6,000x12) | 72,000 |
| අඩුකළා: වර්ෂය සඳහා අයිතිකරු විසින් ගෙවූ වරිපනම් | (7,500) |
| | 64,500 |
| අඩුකළා: අළුත්වැඩියාවන් සඳහා රු.64,500 න් 25% ක් | (16,125) |
| ආදායම් බද්දට යටත් ශුද්ධ කුලිය (කුලී ආදායම) | 48,375 |
| | ======= |

ශුද්ධ කුලිය, ශුද්ධ වාර්ෂික වටිනාකමට වඩා අඩු නම් අයිතිකරුගේ ආදායම විය යුත්තේ.

(i) දේපල හිස්ව තිබූ සහ/හෝ කුලිය අය කර ගැනීමට නොහැකි වූ මාස ගණන:

(ii) පදිංචිකරුගේ ආදායම (තිබේ නම්) සඳහා ගැලපුම් කළයුතු නම් ඊට යටත්ව, ශුද්ධ වාර්ෂික වටිනාකමයි (ශු.වා.ව.ගණනය සඳහා පහත අයිතම (ii) බලන්න)

**කුලිය - නිදහස් කිරීම් -**

- 2003.04.01 දිනට පෙර ඉදි කරන ලද සහ හුදෙක් වාසික කාර්යය සඳහා පමණක් පාවිච්චි කරනු ලැබූ බිම් වර්ග ප්‍රමාණය ව.අඩි 2000 නොඉක්මවන නිවාසයකින් අයිතිකරුට උපචිත වන කුලිය, එම නිවස ඉදි කිරීම අවසන් කළ තක්සේරු වර්ෂය සඳහා සහ ඊළඟ වර්ෂ හය (6) සඳහා බද්දෙන් නිදහස්ය. නිවසේ බිම් වර්ග ප්‍රමාණය වර්ග අඩි 1,500 නොඉක්මවන්නේ නම් එකී නිවස සඳහා තවත් වසර තුනක (3) කාලයක් සඳහා කුලිය බද්දෙන් නිදහස්වේ. හෝ
- 2003.04.01 දින හෝ එදිනට පසු නමුත් 2008.04.01 දිනට පෙර ඉදි කිරීම් සම්පූර්ණ කරන ලද වාසික කාර්ය සඳහා පමණක් භාවිතා කරන ලද නිවසකින් අයිතිකරුට උපචිත වන කුලිය ඉදිකිරීම් අවසන් කළ තක්සේරු වර්ෂය සඳහා සහ ඊළඟ තක්සේරු වර්ෂ 4 සඳහා බද්දෙන් නිදහස් වේ. එකී නිවසෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි 1500 නොඉක්මවන්නේ නම් බදු නිදහස තවත් වසර දෙකක් (2) සඳහා අදාල වේ. (ඉදි කළ වර්ෂය සහ ඊළඟ වර්ෂ 6)
- 2008.04.01 දින හෝ එදිනට පසුව ඉදිකරන ලද හුදෙක් වාසික කාර්ය සඳහා පමණක් පාවිච්චි කරනු ලැබූ නිවසක බිම් ප්‍රමාණය වර්ග අඩි 500 නොඉක්මවන්නේ නම් එහි කුලිය ඉදි කිරීම් අවසන් කළ තක්සේරු වර්ෂය හා තවත් වසර හතරක් (4) සඳහා බදු නිදහස දෙනු ලැබේ.

(ii) **ශුද්ධ වාර්ෂික වටිනාකම -** අයිතිකරු නිවසේ පදිංචි වී සිටින්නේ නම් හෝ අන් අයෙකු ඔහු වෙනුවෙන් එහි පදිංචි වී සිටින්නේ නම් එම නිවසේ ශුද්ධ වාර්ෂික වටිනාකම අයිතිකරුගේ ආදායම වශයෙන් සැලකේ. නිවසක්, අයිතිකරු ඔහුගේ හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයෙකුගේ පාවිච්චිය සඳහා වෙන් කර ඇති විට, එම නිවස අයිතිකරු වෙනුවෙන් පදිංචි වී ඇති ලෙස සලකනු ලැබිය හැකිය.

ශුද්ධ වාර්ෂික වටිනාකම පහත දැක්වෙන පරිදි ගණනය කරනු ලැබේ.

(අ) පලාත් පාලන ආයතනයක් විසින් වරිපනම් කාර්යයන් සඳහා නිවසක වටිනාකම තක්සේරු කර ඇති විට ශුද්ධ වාර්ෂික වටිනාකම වන්නේ 25% කින් අඩු කරන ලද වරිපනම් තක්සේරුවයි.

| | | රුපියල් |
|---|---|---|
| උදා: | වරිපනම් තක්සේරුව (වාර්ෂික වටිනාකම) | 30,000 |
| | අඩුකළා : 25% | (7,500) |
| | ශුද්ධ වා.වටිනාකම | 22,500 |

(ආ) නිවසක් වරිපනම් කාර්යය සඳහා තක්සේරු කර නොමැති විට කුලී නිවැසියා විසින් ගෙවනු ඇතැයි සාධාරණව බලාපොරොත්තු විය හැකි කුලිය පදනම් කරගෙන ඉන් 25% ක් අඩු කිරීමෙන් ශුද්ධ වාර්ෂික වටිනාකම තීරණය කරනු ලැබේ. (ඔබ පදිංචිව සිටින හෝ ඔබ වෙනුවෙන් අන් අයෙකු පදිංචිව සිටින සියළුම නිවාසවල ශුද්ධ වාර්ෂික වටිනාකම ඔබ විසින් ප්‍රකාශ කළ යුතුය.)

(iii) **පදිංචිකරුගේ ආදායම -** පුද්ගලයෙකු කුලී රහිතව නිවාසයක පදිංචි වී සිටින විට හෝ එම නිවසේ ශුද්ධ වාර්ෂික වටිනාකමට වඩා අඩු කුලියක් ගෙවමින් පදිංචි වී සිටින විට දී අවස්ථාවෝචිත පරිදි, ශුද්ධ වාර්ෂික වටිනාකම හෝ ඔහු විසින් ගෙවනු ලබන කුලියට වඩා වැඩි වන්නා වූ ශුද්ධ වාර්ෂික වටිනාකමේ අතිරික්තය, ඔහුගේ ආදායම වශයෙන් සලකනු ලැබේ.

**ශුද්ධ වාර්ෂික වටිනාකම - නිදහස් කිරීම්:**

(අ) ඔබ හෝ ඔබ වෙනුවෙන් පදිංචි වී සිටින එක් නිවාසයක ශුද්ධ වාර්ෂික වටිනාකම බද්දෙන් නිදහස්ය.

(ආ) යම් නිවාසයක ශුද්ධ වාර්ෂික වටිනාකම:

- එම නිවාසය 2003.04.01 දිනට පෙර ඉදි කරන ලද්දක් නම් සහ එහි අයිතිකරු පදිංචි වී සිටින්නේ නම් එම නිවාසය ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂය සඳහා සහ ඊළඟ වර්ෂ හය (6) සඳහා අයිතිකරුගේ ශුද්ධ වාර්ෂික වටිනාකම බද්දෙන් නිදහස්ය. අයිතිකරු පදිංචි වී සිටින මෙවැනි නිවාසයක බිම් ප්‍රමාණය වර්ග අඩි 1500 නොඉක්මවන්නේ නම් තවත් වසර තුනක (3) කාල පරිච්ජේදයක් සඳහා බදු නිදහස ලැබෙනු ඇත.

- එම නිවාසය 2003.04.01 දින හෝ එදිනට පසු නමුත් 2008.04.01 දින හෝ එදිනට පෙර ඉදි කරන ලද්දක් නම් සහ එහි අයිතිකරු පදිංචි වී සිටින්නේ නම් එම ඉදිකිරීම් සම්පූර්ණ කළ තක්සේරු වර්ෂය සහ ඊළඟ වර්ෂ හතර (4) සඳහා අයිතිකරු ශුද්ධ වාර්ෂික වටිනාකම මත බද්දෙන් නිදහස්ය. එකී නිවස 2008.04.01 දින හෝ එදිනට පසුව ඉදි කර ඇත්නම්, සහ නිවසෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි 1500 නොඉක්මවන්නේ නම් බදු නිදහස තවත් වර්ෂ දෙකක් සඳහා ලැබෙනු ඇත.

- 2008.04.01 දින හෝ එදිනට පසුව ඉදිකරන ලද හුදෙක් වාසික කාර්ය සඳහා පමණක් පාවිච්චි කරනු ලැබූ නිවසක බිම් ප්‍රමාණය වර්ග අඩි 500 නොඉක්මවන්නේ නම් එහි ශුද්ධ වාර්ෂික වටිනාකම ඉදි කිරීම් අවසන් කළ තක්සේරු වර්ෂය හා තවත් වසර හතරක් (4) සඳහා බදු නිදහස දෙනු ලැබේ.

**බද්දට යටත් කුලී ආදායම 3 වන උපලේඛනයේ 3 (අ) හිද, ශුද්ධ වාර්ෂික වටිනාකම එහි 3 (ආ) හිද ප්‍රකාශ කළ යුතුය. කුලී හා ශුද්ධ වාර්ෂික වටිනාකමේ සමස්ත එකතුව (එනම් උපලේඛන 3 හි 125 කොටුවේ සඳහන් අගය) වාර්තාවේ 120 වැනි කොටුවේ ඇතුළත් කළ යුතුය.**

**යම් බද්දෙන් නිදහස් ආදායමක් වේ නම් එම බද්දෙන් නිදහස් ආදායම වාර්තාවේ 4 කොටසෙහි (බද්දෙන් නිදහස් ආදායම) ප්‍රකාශ කරන්න.**

## 04. ලාභාංශ : (4 වැනි උපලේඛනය)

සමාගම ලාභාංශ ප්‍රකාශයට පත් කරන දිනයේදී ලාභාංශ ආදායම උද්ගත වේ. කෙසේ වුවද, ලාභාංශයක් මතු දිනයක ගෙවිය යුතු යයි සමාගම විසින් ප්‍රකාශ කරන විට එම මතු දිනයේදී ආදායම උද්ගත වන ලෙස සැලකේ. බද්දට යටත් වන දළ ලාභාංශ ආදායම 4 වන උපලේඛනයේ ප්‍රකාශ කරන්න.

ප්‍රභවයේදී 10% අනුප්‍රමාණය මත බදු අඩු කර ඇති යම් ලාභාංශයක් තවදුරටත් බද්දට යටත් නොවේ. එවැනි ලාභාංශ 4 වන උපලේඛනයේ ලාභාංශ ආදායම යටතේ ප්‍රකාශ කිරීම අවශ්‍ය නොවේ. ප්‍රභවයේදී බදු අඩු කර නොමැති බද්දට යටත් ලාභාංශ වේ නම් ඒවා පමණක් ප්‍රකාශ කරන්න.

**10% බද්ද අඩු කර ඇති යම් ලාභාංශ වේ නම් ඒවා 4 කොටසේ මුළු ව්‍යවස්ථාපිත ආදායමේ ඇතුළත් නොකළ ආදායම යටතේ ප්‍රකාශ කරන්න.**

**බද්දට යටත් මුළු ලාභාංශ ආදායමක් වේ නම්(131 වන කොටුව) වාර්තාවේ 130 කොටුවේ ප්‍රකාශ කරන්න.**

**ලාභාංශ - නිදහස් කිරීම්** -

සමාගමක බද්දෙන් නිදහස් ලාභවලින් බදු විරාම කාලය තුළ හෝ එයින් පසු එක් වර්ෂයක් තුළ හෝ සමාගම විසින් ප්‍රකාශ කරනු ලබන සමහර ලාභාංශ බද්දට යටත් නොවේ. කෙසේ වෙතත්, පහත දැක්වෙන එවැනි ලාභාංශ ආදායම් **බද්දෙන් නිදහස් නොවන** අතර, ප්‍රභවයේදී බදු අඩු කිරීමටද යටත් වේ.

(i) 2002 නොවැම්බර් මස 06 දින හෝ ඉන්පසු ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්වලට එළඹී සමාගමක් විසින් ප්‍රකාශයට පත් කරන ලාභාංශ;

(ii) දේශීය ආදායම් පනතේ 10 (උ) වගන්තියේ සඳහන් යම් වගන්තියක් යටතේ බද්දෙන් නිදහස් වන ලාභයෙන්, 2002 නොවැම්බර් මස 06 දින හෝ ඉන්පසු එකී බදු නිදහස සඳහා සුදුසුකම් ලැබුවා වූ යම් සමාගමක් විසින් ප්‍රකාශයට පත් කරන ලාභාංශ .

ශ්‍රී ලංකාවේ වාසික කොටස් හිමියෙකුට ශ්‍රී ලංකාවේ නිර්වාසික සමාගමක් විසින් 2008.04.01 දින හෝ එදිනට පසුව ගෙවන ලද යම් ලාභාංශයක්, බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම් එම ලාභාංශය ආදායම් බද්දෙන් නිදහස් වේ.

## 05. පොලිය ( 5 වැනි උපලේඛනය)

පොලී, වාර්ෂික හෝ රාජ්‍ය භාගවලින් ලැබෙන ආදායම වනුයේ ලැබුණු හෝ නොලැබුණු එහෙත් ලැබීමට නියමිත සම්පූර්ණ මුදලය. පිටරටකින් පොලී ලැබෙන කල්හි ශ්‍රී ලංකාව එකී රට සමග ද්විත්ව බදු වැලැක්වීමේ ගිවිසුමකට එළඹී නොමැත්තේ නම් එම පොලිය වෙනුවෙන් එම රටෙහි දී ගෙවිය යුතු බද්දක් වෙතොත් එය අඩු කොට ඉතිරි ශුද්ධ මුදල ආදායම ලෙස පෙන්නුම් කළ යුතුය. ශ්‍රී ලංකාව සමග ද්විත්ව බදු වැලැක්වීමේ ගිවිසුම්වලට එළඹ ඇති රටකින් පොලී ආදායම ලබන්නේ නම් දළ ආදායම ප්‍රකාශ කළ යුතුය. වෙනත් අඩු කිරීම් සඳහා ඉඩදෙනු නොලැබේ.

නියමිත පොලිය ලැබී නොමැති විට සහ අයකර ගැනීමට නොහැකි සේ පෙනෙන විට එබඳු පොලී අත්හැර දැමිය හැකි අතර, එම පොලී විස්තර වාර්තාවට අමුණන උපලේඛනයක් මගින් දැක්විය යුතුය.

**10% හෝ ඊට අඩු ප්‍රතිශතයකින් රඳවා ගැනීමේ බද්ද අඩු කරනු ලබන යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ඇති තැන්පතුවක් මත පොලිය** 5 වැනි උපලේඛනයෙහි ප්‍රකාශ කළ යුතු නොවේ. ප්‍රාථමික අලෙවිකරු වෙතින් 10% ක රඳවා ගැනීමේ බද්දක් අඩු කරගෙන ඇති රජයේ සුරැකුම් පත් මත පොලියද ඇතුළත්ව එම පොලිය 4 කොටසේ **මුළු ව්‍යවස්ථාපිත ආදායමේ ඇතුලත් නොකළ ආදායම** යටතේ ප්‍රකාශ කළ යුතුය.

**පොලී ආදායම (10% හෝ ඊට අඩු ප්‍රතිශතයකින් රඳවා ගැනීමේ බදු අඩු කරන ලද ආදායම් හැර) උපලේඛන 5 හි ප්‍රකාශ කරන්න.**

**මුළු පොලී ආදායම් ( උපලේඛන 5 හි 141 කොටුව) වාර්තාවේ 140 කොටුවෙහි ඇතුළත් කළ යුතුය.**

<u>බද්දෙන් නිදහස් පොලිය</u>

යම් පුද්ගලයෙකු ලබන පහත සඳහන් පොලී ආදායම් බද්දෙන් නිදහස්ය.

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත තිබූ විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු කර තැන්පත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව වාණිජ බැංකුවක විවෘත කර ඇති විශේෂ ගිණුමක තැන්පතු මත උපචිත වන පොලිය.

(ආ) විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක විදේශ ව්‍යවහාර මුදලින් ඇති මුදල් මත උපචිත වන පොලිය.

(ඇ) මහ බැංකුවේ අනුමැතිය ඇතිව විවෘත කරන ලද නිර්වාසික හෝ වාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල තැන්පත් මුදල් මත උපචිත වන පොලිය.

(ඈ) අනුමත විදේශ ව්‍යවහාර මුදල් ණයක් සම්බන්ධයෙන් රජය විසින් නිකුත් කරන ලද යම් සුරැකුම්පතක්, නෝට්ටුවක් හෝ කූපනයකින් යම් තැනැත්තෙකුට උපචිත වන පොලිය.

(ඉ) ඇමෙරිකන් ඩොලර්වලින් වටිනාකම නියම කර ඇති ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන ප්‍රතිසංස්කරණ බැඳුම්කරවල ආයෝජනය කරන මුදල් මත යම් තැනැත්තෙකුට උපචිත වන පොලිය.

(ඊ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ඇමෙරිකන් ඩොලර්වලින් වටිනාකම නියම කර ඇති ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කරන මුදල් මත යම් තැනැත්තෙකුට උපචිත වන පොලිය.

(උ) වයස අවුරුදු 59 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියෙකු (ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු) විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, සීමාසහිත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකුව, සීමාසහිත ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවා ඇති යම් බැංකුවක හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනතේ අර්ථානුකූලව වූ යම් ලියාපදිංචි සමිතියක යම් තැන්පත් මුදලක් මත ලබන රු.200,000/- දක්වා පොලිය.

(ඌ) යම් භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුමක තැන්පත් කරන ලද යම් මුදලකින් උපචිත වන පොලිය.

(එ) ශ්‍රී ලංකාවෙන් පිටතදී කරන ලද ආයෝජනයකින් 2008 අප්‍රේල් මස 01 දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවේ වාසික යම් තැනැත්තෙකුට උපචිත වන හෝ ඇති වන යම් පොලියක් බැංකුව හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, එම පොලිය.

## 06. <u>වාර්ෂික සහ රාජ්‍ය භාග (6 වැනි උපලේඛනය)</u>

වාර්ෂික සහ රාජ්‍ය භාග 6 වැනි උපලේඛනයේ ප්‍රකාශ කල යුතුය. වාර්ෂික සහ රාජ්‍ය භාගවලින් ලබන මුළු ආදායම (6 වැනි උපලේඛනයේ 151 කොටුව) වාර්තාවෙහි 150 කොටුවෙහි සඳහන් කල යුතුය.

<u>බද්දෙන් නිදහස් වාර්ෂික</u>

ජීවිත කාලයටම හෝ වසර 10 කට නොඅඩු කාලයක් සඳහා බැංකුවකින් හෝ අනුමත රක්ෂණ සමාගමක් වෙතින් මිලදී ගත්තාවූද, මිලදී ගැනීම සඳහා මුදලින් හෝ මුදල් වටිනාකමින් ගෙවූ පූර්ණ ප්‍රතිශ්ඨාව වෙනුවෙන් වයස අවුරුදු 60 ක් හෝ ඊට වැඩි පුද්ගලයෙකු හට උපචිත වන වාර්ෂිකයක් ආදායම් බද්දෙන් නිදහස් වේ.

## 07. වෙනත් යම් ප්‍රභවයකින් ලැබෙන ආදායම් (7 උප ලේඛනය)

ඉහත සඳහන් නොකල වෙනත් ආදායම් ප්‍රභවයන් 7 වැනි උපලේඛනයේ දක්වන්න. කරුණාකර මෙම ආදායම් පිළිබඳ විස්තර සපයන්න.

වෙනත් ප්‍රභවයන්ගෙන් වූ මුළු ආදායම (7 වන උපලේඛනයේ 161 කොටුව) වාර්තාවේ 160 කොටුවෙහි ඇතුළත් කල යුතුය.

**මුළු ව්‍යවස්ථාපිත ආදායම**

100 සිට 160 කොටු යටතේ සඳහන් කර ඇති සියළු ආදායම්වල එකතුව වාර්තාවේ 190 කොටුවේ ඇතුලත් කරන්න. මෙම මුළු එකතුව මුළු ව්‍යවස්ථාපිත ආදායම යනුවෙන් හැඳින්වේ.

# 2 වැනි කොටස

## මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කිරීම්

08. අලාභ - 8 වැනි උපලේඛනය

(1) **වෙළඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් උද්ගත වූ යම් අලාභයක් -**

වෙළඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් උද්ගත වූ යම් අලාභයක් එකී අලාභය ලාභයක් වූයේ නම් හා එයට තක්සේරු කළ හැකි වන්නේ නම් (උපරිම සීමාවට යටත්ව) අඩු කිරීමක් ලෙස ඉඩ දෙනු ලැබේ. ජීවිත රක්ෂණ හෝ ව්‍යාපාරයේදී මූල්‍ය කල්බදු සිදු වන අලාභයක් හැර 2008.04.01 සිට 2009.03.31 දක්වා කාල පරිච්ඡේදය තුල සිදුවූ එවැනි අඩු කළ හැකි අලාභයක් සහ කලින් වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ අඩු කළ හැකි යම් අලාභයක් මෙම තක්සේරු වර්ෂයේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් 35% ක (වාර්තාවේ 190 කොටුවෙහි ප්‍රමාණයන්) උපරිම සීමාවකට යටත්ව, අඩු කළ හැකිය. ජීවිත රක්ෂණ හෝ මූල්‍ය කල්බදු ව්‍යාපාරයකින් සිදු වන අලාභයක් අඩු කළ හැක්කේ එම ව්‍යාපාරය මගින් උපයනු ලබන ලාභයෙන් පමණි.

**පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ (යම් අඩු කළ හැකි) අලාභ තිබේ නම් 8 වන උපලේඛනයේ 201 කොටුවේ සඳහන් කරන්න. 2008/2009 තක්සේරු වර්ෂය සඳහා අඩු කල හැකි අලාභයේ වටිනාකම 203 කොටුවේ හෝ 204 කොටුවේ සඳහන් අවම ප්‍රමාණයයි. 8 වැනි උපලේඛනයේ 204 කොටුවේ සඳහන් වටිනාකම ප්‍රතිලාභ 200 කොටුවේ සඳහන් කළ යුතුය.**

(2) **කොටස් විකිණීම් මත අලාභ**

කොටස් ගණුදෙනුවක් සම්බන්ධයෙන් "කොටස් හුවමාරු බද්ද" ගෙවා ඇත්නම් එකී කොටස් විකිණීමෙන් ලැබෙන යම් ලාභයක් ආදායම් බද්දෙන් නිදහස් වේ. එවැනි ගණුදෙනුවකින් සිදු වන අලාභයක් අඩු කළ නොහැක.

මුළු ව්‍යවස්ථාපිත ආදායමේ 35% ගණනය කිරීමේ කාර්යය සඳහා මුළු ව්‍යවස්ථාපිත ආදායම යන්නෙන් අදහස් කෙරෙනුයේ අවසාන බද්ද ලෙස රඳවා ගැනීමේ බද්ද අඩුකර ගන්නා ලද පොලියක්, ලාභාංශයක්, ත්‍යාගයක්, දඩ කොටසක්, හෝ ලොතරැයි හෝ සූදු දිණුමක් යනාදිය ඇතුලත් නොවන මුළු ව්‍යවස්ථාපිත ආදායම වේ.

ඉතිරි වූ යම් අලාභයක් (උපලේඛන 8 හි කොටු 202-204) ඉදිරි තක්සේරු වර්ෂයට ගෙන යා හැකිය. (උපලේඛන 8 හි 205 කොටුව)

## 09. පොලී, වාර්ෂික, රාජ්‍යභාග හෝ බිම් කුලී යනාදිය - ( 9 වැනි උපලේඛනය)

(i) බැංකුවකට හෝ වෙනත් ණය හිමියෙකුට ගෙවන ලද ආදායම් ඉපයීමේදී දරන පොලී, වෙළඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රැකියාවකින් ලබන ලාභය (ව්‍යවස්ථාපිත ආදායම) නිශ්චය කිරීමේදී අඩු කිරීමක් ලෙස ඉල්ලා සිටිය හැකිය.

(ii) (අ) වෙළඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන ආදායම ගණනය කිරීමේදී අඩු කළ නොහැකි වූ පොලියක් වන, ගොඩනැගිල්ලක් ඉදි කිරීමට හෝ මිලදී ගැනීමට ගත් ණයක් මත, නෛතික හෝ ගිවිසුම්කාර බැඳීමක් යටතේ බැංකුවකට, මූල්‍ය ආයතනයකට හෝ කොමසාරිස් ජනරාල් විසින් පිළිගනු ලැබූ පිළිගත් ආයතනයකට ගෙවූ වෙනත් යම් පොලියක්: සහ

(ආ) ගෙවූ යම් බිම් කුලී, වාර්ෂික හෝ රාජ්‍ය භාග: (ආදායම් ඉපයීමේදී අඩු නොකළ)

9 වන උපලේඛනයේ "අ" හෝ "ආ" යටතේ ප්‍රකාශ කළ යුතුය.

### තක්සේරු කළ හැකි ආදායම

තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීම සඳහා (230 කොටුවෙහි) මුළු අඩුකිරීම් (190 කොටුවේ) මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරන්න.

මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කළ නොහැකි යම් අතිරික්ත අඩුකිරීම් ඉදිරියට ගෙන යා හැකි අතර (8 උපලේඛනයේ 205 කොටුව) ඒවා ඉන්පසුව එළඹෙන වර්ෂයේ යම් අඩු කළහැකි අලාභයක් ද සමග එම වර්ෂයේදී මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් 35% ක සීමාවකට යටත්ව අඩු කළ හැකිය. (ජීවිත රක්ෂණ හෝ මූල්‍ය කල්බදු ව්‍යාපාර අලාභයක් වේ නම් එය අඩු කළ හැක්කේ එවැනි ලාභයකින් පමණි).

### බදු අයකළ හැකි ආදායම

තක්සේරු වන ආදායමෙන් පහත දීමනාවල එකතුව අඩුකළ පසු ඉතිරිය බදු අයකල හැකි ආදායම වේ.

(අ) බදු නිදහස් දීමනාව රු.300,000 (මෙම දීමනාව නිර්වාසිකයන්ට හිමි නොවේ.);

සහ

(ආ) සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් දීමනාව

## 10. සුදුසුකම් ලබන ගෙවීම් සඳහා දීමනාව (10 වැනි උපලේඛනය)

(1.) **සුදුසුකම් ලබන ගෙවීම්**

(A) මුදලින් හෝ වෙනත් ආකාරයකින්;

- රජයට ;
- පලාත් පාලන ආයතනයකට;
- රජය විසින් පිහිටුවනු ලැබූ අරමුදලකට හෝ පලාත් පාලන ආයතනයක් හෝ පලාත් සභාවක් විසින් පිහිටුවනු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කල අරමුදලකට;
- බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයට හෝ එම විශ්ව විද්‍යාල පනත යටතේ හෝ විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටවූ යම් උසස් අධ්‍යාපන ආයතනයකට;
- සෙවන අරමුදලට; (10 උපලේඛනයේ 304 කොටුව)
- **" අපි වෙනුවෙන් අපි "** අරමුදලට

  කරනු ලැබූ පරිත්‍යාග; හෝ
- කලින් වසරින් ඉදිරියට ගෙන ආ එවැනි යම් සුදුසුකම් ලබන ගෙවීමක යම් අඩු නොකරන ලද ශේෂයක් (10 උපලේඛනයේ 302 කොටුව)

(B) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව, රජයේ සංවර්ධන සැලැස්මක ඇතුලත් කිසියම් ව්‍යාපෘතියක් සඳහා යම් තැනැත්තෙකු විසින් දරන ලද වියදම් (එසේ දැරූ වියදම්වල සම්පූර්ණ විස්තරයක් අදාල ලේඛනවල පිටපත්ද සමග ඉදිරිපත් කරන්න.) (10 උපලේඛනයේ 310 කොටුව) හෝ අඩු නොකරන ලද ඉදිරියට ගෙන ආ යම් ශේෂයන් (10 උපලේඛනයේ 308 කොටුව)

(C) කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද ස්වයං රැකියාවල නියුතු පුද්ගලයන් සඳහා වූ අර්ථසාධක අරමුදලකට යම් පුද්ගලයෙකු විසින් කරන ලද දායකත්වය (10 උපලේඛනයේ 314 කොටුව)

(D) පනතේ 34 (2) (ඊ) වගන්තියේ සඳහන් නිශ්චිතව දක්වා ඇති ආයතනයන්ට කරන ලද පරිත්‍යාගයන් (10 උපලේඛනයේ 316 කොටුව)

(E) ඉදිකරන ලද නිවාස හෝ මිලදී ගත් නිවාස හෝ බිම් කැබලි සඳහා 1994.04.01 දිනට පෙර කරන ලද වියදම් (10 උපලේඛනයේ 318 කොටුව)

(අ) (i) - නිවසක් ඉදි කිරීම සඳහා; හෝ

- 1973 .04.01 දින හෝ ඉන් පසුව මිලදී ගත් පලමුවන නිවස මිලදී ගැනීම සඳහා හෝ නිවාසයක් ඉදිකිරීම පිණිස එදිනෙන් පසු පලමුවන බිම් කොටස මිලදී ගැනීම සඳහා;

1973.04.01 දින හෝ ඉන් පසුව එහෙත් 1989.03.31 දින හෝ ඊට පෙර ලබාගත් යම් ණය මුදලක මුල් මුදල ආපසු ගෙවනු ලැබීමේදී;

(ii) - 1978.04.01 දින හෝ ඉන්පසුව ඉදි කරන ලද පලමුවන නිවාසය වන ඉදිකිරීම් පිරිවැය රු.1,000,000/- නොඉක්මවන නිවසක් ඉදි කිරීම සඳහා; හෝ

- 1978.04.01 දින හෝ ඉන්පසුව මිලදී ගත් පලමුවන නිවාසය හෝ නිවාසයක් ඉදිකිරීම සඳහා වූ පලමුවන බිම් කොටස වන පිරිවැය රු.1,000,000/- නොඉක්මවන නිවසක් හෝ ඒ සඳහා බිම් කොටසක් මිලදී ගැනීම සඳහා;

1989.04.01 දින හෝ ඉන් පසුව එහෙත් 1994.04.01 දිනට පෙර ප්‍රදානය කරනු ලැබූ යම් ණයක මුල් මුදල ආපසු ගෙවනු ලැබීමේදී;

(iii) - 1973.04.01 දින හෝ ඉන්පසුව එහෙත් 1989.04.01 දිනට පෙර කුලියට සින්නවීමේ නියමයන් මත කුලියට ගන්නා ලද නිවාසයක් සම්බන්ධයෙන්,

- 1989.04.01 දින හෝ ඉන්පසුව එහෙත් 1994.04.01 දිනට පෙරාතුව එළඹියාවූ ද අදාල ප්‍රතිප්ඨාව රු.1,000,000/- නොඉක්මවන්නාවූ ද කුලියට සින්නවීමේ ගිවිසුමක් ප්‍රකාරව 1978.04.01 දින හෝ ඉන්පසුව මිලදී ගන්නා ලද පලමු නිවස සම්බන්ධයෙන් මාසික ගෙවීම් වශයෙන් ;

කිසියම් පුද්ගලයෙකු විසින් රජයට, යම් බැංකුවකට, යම් පලාත් පාලන ආයතනයකට හෝ නිවාස විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ආයතනයකට ගෙවන ලද යම් මුදලක්.

(F) යම් තැනැත්තෙකු විසින් අනුමත පුණ්‍යායතනයකට මුදලින් කරන ලද පරිත්‍යාග (කුවිතාන්සි අමුණන්න) (10 වන උපලේඛනයේ 324 කොටුව)

(G) යම් පුද්ගලයෙකු විසින් කොමසාරිස් ජනරාල් විසින් අනුමත යම් අර්ථ සාධක/විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ යම් පරිපාලිත අර්ථසාධක අරමුදලකට ගෙවූ දායක මුදල්.

කෙසේ වුවද, දායක මුදල පඩිනඩිවලින් 12% කට වැඩි නම් එම අතිරික්තය සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සලකනු නොලැබේ. තවද, සහනය ලැබෙන්නේ අදාල පඩිනඩි බද්දෙන් නිදහස් නොවේ නම් පමණි. (10 වන උපලේඛනයේ 326 කොටුව)

(H)
- වසර තුනකට නොඅඩු කාලයක් මුළුල්ලේ වාර මුදල් ගෙවිය යුතු හුදෙක් පරිත්‍යාග රක්ෂණ ඔප්පුවක් නොවන ජීවිත රක්ෂණ ඔප්පුවක්, හෝ
- වෛද්‍ය රක්ෂණ ඔප්පුවක්,

මත ශ්‍රී ලංකාවේදී ගෙවනු ලබන ජීවිත රක්ෂණ වාර මුදල් **(10 වන උපලේඛනයේ 328 කොටුව)**

(I) රුපියල් මිලියන 05 කට නොඅඩු පිරිවැයක් දරා 2000 ජනවාරි මස 01 දින ඉන්පසුව නිෂ්පාදනය ආරම්භ කරන ලද යම් චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් දරනු ලබන වියදම් (චිත්‍රපටය නිෂ්පාදනය නිම වූ දිනයේ සිට දින 90 ක් ඇතුලත එහි ප්‍රවර්ධනාත්මක කටයුතු සම්බන්ධයෙන් දරනු ලබන වියදමද පිරිවැයට ඇතුලත් වේ.)

(i) 2007.04.01 දිනට පෙර නිෂ්පාදනය අවසන් කරන ලද කලින් වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ යම් අඩු කර ගත නොහැකි වූ ශේෂයක් (රුපියල් මිලියන 10 සීමාව තුල) **10 වන උපලේඛනයේ 334 කොටුවේ** ඇතුලත් කළ යුතුය.

(ii) 2007.04.01 දින හෝ එදිනට පසුව නිෂ්පාදනය අවසන් කරන ලද කලින් වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ යම් අඩු කර ගත නොහැකි වූ ශේෂයක් (රුපියල් මිලියන 25 සීමාව තුල) **10 වන උපලේඛනයේ 335 කොටුවේ ඇතුලත් කළ යුතුය.**

(iii) වර්ෂය තුල චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමට දරන ලද වියදම් (එනම්, වර්ෂය තුළදී නිෂ්පාදනය නිම කළ) **10 උපලේඛනයේ 336 කොටුවේ ඇතුලත් කළ යුතුය.**

(J) 2001.04.01 දින හෝ ඉන්පසුව ඉදිකරන ලද හෝ මිලදී ගන්නා ලද පලමු නිවාසය වන, නිවසක් ඉදි කිරීම හෝ මිලදී ගැනීම සඳහා යම් පුද්ගලයෙකු විසින් දරන ලද (K) ඡේදයෙහි සඳහන් වියදම් හැර, යම් වියදමක් **(10 වන උපලේඛනයේ 342 සහ 344 වැනි කොටු) .**

(K) 2001.04.01 දින හෝ ඉන්පසුව ඉදි කරන ලද හෝ මිලදී ගන්නා පලමු නිවාසය වන, නිවස ඉදි කිරීම හෝ මිලදී ගැනීම සඳහා වූ යම් අනුමත නිවාස ණය මුදලක මුල් මුදල ආපසු ගෙවීම සඳහා යම් පුද්ගලයෙකු විසින් දරන ලද යම් වියදමක්.

මෙම කාර්යය සඳහා "අනුමත නිවාස ණය මුදල" යනුවෙන් මුදල් නීති පනතෙහි (422 පරිච්ඡේදයේ) අර්ථය ඇතුලත රජයෙන් හෝ යම් බැංකු ආයතනයකින් ලබා ගත් හෝ යම් පලාත් අරමුදලක්, යම් පලාත් පාලන අධිකාරියක් හෝ නිවාස විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් ආයතනයකින් ලබා ගත් යම් නිවාස ණය මුදලක් අදහස් කෙරේ. **(10 වන උපලේඛනයේ 348 වැනි කොටුව) .**

(L) 23 (1) වගන්තිය යටතේ බදු නිදහස් කාල සීමාව තුලදී අවදානම් ප්‍රාග්ධන සමාගමක් විසින් නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් මිලදී ගැනීමේ දී රු.500,000/- කට නොඅඩු වන ආයෝජනයක් කර ඇත්නම් එයින් 50% ක් **(10 වන උපලේඛනයේ 354 වැනි කොටුව) .**

(M) 1997 නොවැම්බර් මස 06 වැනි දින හෝ ඉන්පසුව සංස්ථාගත කරන ලද සහ

(අ) ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනයෙහි නිරත වූ ද

(ආ) 2000 මාර්තු 31 දිනට,

- රුපියල් මිලියන 300 කට නොඅඩු ප්‍රාග්ධනයක් නිකුත් කර තිබෙන්නා වූ, සහ
- ප්‍රාග්ධන වත්කම්(ගොඩනැගිලි,ඉඩම්,පිරියත හා යන්ත්‍රෝපකරණ යනාදිය)

අත්කර ගැනීම පිණිස රුපියල් මිලියන 500 කට නොඅඩු මුදලක් ආයෝජනය කර ඇත්තා වූ ද,

ආයෝජන මණ්ඩල සමාගමක අළුතෙන් සාමාන්‍ය කොටස් මිලදී ගැනීම සඳහා 1997 නොවැම්බර් මස 05 දින සහ 2000 අප්‍රේල් මස 01 දින අතර කාලය තුල යම් තැනැත්තෙකු විසින් ආයෝජනය කරන ලද යම් මුදල් ප්‍රමාණයක අඩු නොකල ශේෂයක්. **(10 වන උපලේඛනයේ 358 වැනි කොටුව) .**

(N) 2008 අප්‍රේල් මස 01 දින හෝ එදිනට පසුව සිනමාරූපී චිත්‍රපටි ප්‍රදර්ශනය ආරම්භ කර ඇත්තා වූද, 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් ඩිජිටල් තාක්ෂණය, ඩිජිටල් ප්‍රදර්ශන ක්‍රම හා ඩොල්බි ශබ්ද පද්ධතිවලින් සමන්විත බවට සහතික කරනු ලැබුවාවූද සිනමා ශාලාවක් ඉදි කිරීමේදී හා එයට උපකරණ සැපයීමේදී දරන ලද මිලියන 25 කට නොවැඩි වියදමක්. **(10 වන උප ලේඛනයේ 362 කොටුවේ ඇතුලත් කරන්න)**

(O) 2008 අප්‍රේල් මස 01 වන දිනට පෙර සිනමාරූපී චිත්‍රපටි ප්‍රදර්ශනය කිරීම ආරම්භ කර ඇත්තාවූද, 2008 අප්‍රේල් 01 දිනට පෙර ඩිජිටල් තාක්ෂණයේ, ඩිජිටල් ප්‍රදර්ශන ක්‍රම සහ ඩොල්බි ශබ්ද පද්ධතිවලින් සමන්විත නොවූද සහ 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපටි සංස්ථා පනත මගින් පිහිට වූ ජාතික චිත්‍රපට සංස්ථාව විසින් 2008 අප්‍රේල් 01 දිනට පසු ඉහත සඳහන් තාක්ෂණික පද්ධතිවලින් සමන්විත බව සහතික කරනු ලැබූ සිනමා ශාලාවක් තත්ත්වයෙන් වැඩි දියුණු කිරීමේදී දරන ලද රු.මිලියන 10 කට නොවැඩි වියදමක්. **(10 වන උප ලේඛනයේ 367 කොටුවේ ඇතුලත් කරන්න).**

(P) නාගරික සංවර්ධන අධිකාරිය හෝ ජාතික නිවාස අධිකාරිය විසින් අනුමත කළ නිවාස යෝජනා ක්‍රමයක් යටතේ අඩු ආදායම් ලාභීන් සඳහා එක් නිවාසයක බිම් ප්‍රමාණය ව.අ.500 නොඉක්මවන, 2013.04.01 දිනට පෙර එම නිවාස විකිණීම සිදු කරයි නම් එවැනි යෝජනා ක්‍රමයක ආයෝජනය කළ මුදල්. **(10 වන උප ලේඛනයේ 373 කොටුවේ ඇතුලත් කරන්න).**

**(2) ගෙවූ (හෝ ගෙවූ ලෙස සැලකෙන) සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් අඩු කිරීම් :**

දීමනාව, කරන ලද සුදුසුකම් ලබන ගෙවීම් ප්‍රමාණයට සමාන වේ. එසේ වුවද සමහර දීමනා සම්බන්ධයෙන් අඩුකිරීම් පහත දැක්වෙන පරිදි සීමාවන්ට යටත් වේ.

(i) ඉහත (1) උපජේදයේ (A) හා (P) විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් වන අඩුකිරීම් සඳහා සීමාවක් නොමැත.

(ii) (1) උපජේදයේ (B) විෂයාංකයෙහි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධව අඩු කිරීම රුපියල් 25,000/- ක සීමාවට යටත් වේ.

(iii) (1) උපජේදයේ (C) (D) සහ (E) යන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන සියළුම ගෙවීම් සම්බන්ධයෙන් වන මුළු අඩුකිරීම් තක්සේරු වන ආදායමෙන් 1/3 ක හෝ රු.25,000/- යන දෙකෙන් වඩා අඩු ගණන නොඉක්මවිය යුතුය.

(iv) (1) උපජේදයේ (F) (G) සහ (H) වන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් අඩුකිරීම්, තක්සේරුවන ආදායමෙන් 1/3 ක් හෝ රු.75,000/- යන දෙකෙන් වඩා අඩු ගණනට සීමා වේ.

(v) (1) උපජේදයේ (I) යන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් (එනම් එක් චිත්‍රපටයක වියදම) සම්බන්ධයෙන් අඩු කිරීම 2007.04.01 දින හෝ ඉන් පසුව නිෂ්පාදනය කරන ලද එක් චිත්‍රපටයකට රුපියල් මිලියන 35 කට සීමා වේ.

(vi) (1) උපජේදයෙහි (J) සහ (K) යන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධව අඩු කිරීම් තක්සේරුවන ආදායමෙන් 1/3 ක් හෝ රු.100,000/- යන දෙකෙන් වඩා අඩු ප්‍රමාණයට සීමා වේ.

(vii) (1) උපජේදයේ (L) යන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් අඩු කිරීම්, තක්සේරු වන ආදායමෙන් 1/3 කට සීමා වේ.

(viii) (1) උපජේදයේ (M) යන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් අඩු කිරීම, තක්සේරුවන ආදායමෙන් 1/3 කට සීමා වේ.

(ix) (1) උපජේදයේ (N) යන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් අඩු කිරීම, තක්සේරුවන ආදායමෙන් රු.මි.25 කට සීමා වේ.

(x) (1) උපජේදයේ (O) වන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් අඩු කිරීම, තක්සේරුවන ආදායමෙන් රු.මි.10 කට සීමා වේ.

## (3) සුදුසුකම් ලබන ගෙවීම්වල අඩු නොකල ශේෂයන් ඉදිරියට ගෙන යාම;

i. ඉහත (1) උපජේදයේ (A), (B), (I)(ii), (M) (N),(O) හෝ (P) යන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම්වල අඩු නොකල යම් ශේෂයක් වේ නම් මුළු මුදලම අඩු කරනු ලබනතෙක් කාල නියමයකින් තොරව ඉදිරියට ගෙන යා හැකිය.

ii. (1) උපජේදයේ (I) (i) යන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම්හි යම් අඩු නොකල ශේෂයක් වේ නම් චිත්‍රපටයේ නිෂ්පාදන කටයුතු නිම වන වර්ෂයට පසුව එළඹෙන දෙවන තක්සේරු වර්ෂය දක්වා ඉදිරියට ගෙන යා හැකිය.

iii. (1) උපජේදයේ (J) යන විෂයාංකයන්හි සඳහන් සුදුසුකම් ලබන ගෙවීම්හි යම් අඩු නොකල ශේෂයක් වේ නම් එම වියදම් දරන තක්සේරු වර්ෂයට ඉක්බිතිව එළඹෙන අවුරුදු 09 නොඉක්මවන තෙක් ඉදිරියට ගෙන යා හැකිය.

iv. අනිකුත් කිසිදු විෂයක් ඉදිරියට ගෙන යා නොහැක.

**නිදර්ශණ (1)** රජයේ විශ්‍රාමිකයෙකු වන සිල්වා මහතා (2008 අප්‍රේල් මස විශ්‍රාම ගත්) වෙළඳ සමාගමක සේවයෙහි යෙදී සිටී. 2009.03.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඔහුගේ ආදායම මෙසේය.

| | රු. |
|---|---|
| රජයේ විශ්‍රාම වැටුප | 110,000 |
| පරිවර්තිත විශ්‍රාම වැටුප් | 250,000 |
| වෙළඳ සමාගමෙන් වැටුප් | 380,000 |
| ජා.ඉ.බැ. - පොලිය තමාගේ (බදු අඩුකර නැත) | 5,000 |
| වයස අවු:18 ට අඩු පුතාගේ (බදු අඩුකර නැත) | 2,750 |

| | | |
|---|---|---|
| (ශුද්ධ) කුලී ආදායම (වරිපනම් සහ අළුත්වැඩියා දීමනාව | | |
| අඩුකිරීමෙන් පසුව) | | 6,000 |
| භාර්යාවගේ ආදායම (තේ වත්තෙන්) | | 15,000 |
| කෘෂි කර්ම ආදායම් (වගා කිරීම්) | | 50,000 |
| ලාභාංශ | 10,000 | |
| රඳවා ගැනීමේ බද්ද | (1,000) | 9,000 |
| එකතුව | | 827,750 |
| | | ======= |

(i) එම වර්ෂය තුලදී සිල්වා මහතා විසින් නිවාස ණය මත පොලිය වශයෙන් රු.1,000/- ක් බැංකුවට ගෙවා ඇත.

(ii) අනුමත අර්ථසාධක අරමුදලකට දායක මුදල් රු.30,400/- ක් ගෙවා ඇත.

(iii) කොළඹ මහ නගර සභාව විසින් පිහිටුවා ඇති කොළඹ නගර සංවර්ධන අරමුදලට පරිත්‍යාග වශයෙන් රු.2,000/- ක් දී ඇත.

(iv) ටවර් හෝල් පදනමට රු.10,000/- ක් පරිත්‍යාග කර ඇත.

(v) ශ්‍රී ලංකා පිළිකා සංගමයට රු.25,000/- ක් පරිත්‍යාග කර ඇත.

2008/2009 තක්සේරු වර්ෂය සඳහා සිල්වා මහතාගේ බදු අය වන ආදායම පහත දැක්වෙන පරිදි ගණනය කෙරේ.

| | | රුපියල් |
|---|---|---|
| රජයේ විශ්‍රාම වැටුප | | බද්දෙන් නිදහස්ය |
| පරිවර්තිත විශ්‍රාම වැටුප | | බද්දෙන් නිදහස්ය |
| වැටුප - වෙළඳ සමාගමෙන් | | 380,000 |
| ජා.ඉ.බැ. - පොලිය තමාගේ (රඳවා ගැනීමේ බද්ද අඩුකර නොමැත) | | 5,000 |
| පුතාගේ (වයස අවු:18 ට අඩු) පොලී ආදායම | | 2,750 |
| කුලී | | 6,000 |
| කෘෂිකර්මය | | නිදහස් |
| ලාභාංශ - 10% ලාභාංශ බද්ද අඩුකර ඇති නිසා අවසාන බද්ද වේ. | | -- |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | | 393,750 |
| අඩුකලා - ගෙවූ පොලිය | | (1,000) |
| තක්සේරු කල හැකි ආදායම | | 392,750 |
| අඩු කලා - බදු නිදහස් දීමනාව | 300,000 | |
| සුදුසුකම් ලබන ගෙවීම් සඳහා | 67,400 | (367,400) |
| බදු අයකල හැකි ආදායම | | 25,350 |
| | | ======= |

සුදුසුකම් ලබන ගෙවීම් දීමනාව පහත දැක්වෙන අයුරු ගණනය කෙරේ.

| | රුපියල් |
|---|---|
| නගර සංවර්ධන අරමුදලට දායක මුදල් (සම්පූර්ණයෙන් ඉඩදිය හැකිය) | 2,000 |
| අර්ථසාධක අරමුදල් දායක මුදල සහ ශ්‍රී ලංකා පිළිකා සංගමයට පරිත්‍යාග එකතුව රු.55,400 කි. (අඩු කිරීම තක්සේරු කළ හැකි ආදායමෙන් 1/3 ට හෝ රු.75,000/- යන දෙකෙන් අඩු මුදලට සීමා වේ) | 55,400 |
| ටවර්හෝල් පදනමට පරිත්‍යාග (අඩුකිරීම් තක්සේරු කළ හැකි ආදායමෙන් 1/3 ට හෝ රු.25,000 ට සීමා වේ). | 10,000 |
| සුදුසුකම් ලබන ගෙවීම් දීමනාව | 67,400 |
| | ===== |

__නිදර්ශන (II)__

ප්‍රනාන්දු මහතා රජයේ විධායක නිලධාරියෙකි. ඔහුගේ සේවා ආදායම්, අනෙක් ආදායම් සහ ගෙවීම් පිළිබඳව විස්තර මෙසේය.

| | රු. | රු. |
|---|---|---|
| __ආදායම__ | | |
| රජයේ වැටුප | | 600,000 |
| දිරි දීමනා | | 200,000 |
| ව්‍යාපාර ලාභය (බදු කාර්යය සඳහා ගලපන ලද) | | 50,000 |
| කුලී ආදායම (ගලපන ලද) | | 200,000 |
| පොලිය (ජා.ඉ.බැ.) රුඳවුම් බද්ද අඩුකරගෙන ඇත | | 10,000 |
| ලාභාංශ | | 12,000 |
| එකතුව | | 1,072,000 |
| | | ======== |
| __ගෙවීම්__ | | |
| පොලිය - ක්‍රෙඩිට් කාඩ් මත | 1,000 | |
| නිවාස ණය මත | 1,000 | |
| අනුමත පුණ්‍යායතනයක් වෙත පරිත්‍යාග | 15,000 | |
| පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ව්‍යාපාර අලාභය | 250,000 | |

2008/2009 තක්සේරු වර්ෂය සඳහා ප්‍රනාන්දු මහතා විසින් ගෙවිය යුතු බද්ද මෙසේය.

| | |
|---|---|
| රජයේ රැකියාවෙන් - වැටුප | 600,000 |
| දිරි දීමනා | 200,000 |
| ව්‍යාපාර ලාභය | 50,000 |

| | | |
|---|---|---|
| කුලී ආදායම | | 200,000 |
| පොලිය (අඩුකරගෙන ඇති රඳවා ගැනීමේ බද්ද අවසාන බද්ද වේ) | | -- |
| ලාභාංශ (අඩුකරගෙන ඇති රඳවා ගැනීමේ බද්ද අවසාන බද්ද වේ) | | -- |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | | 1,050,000 |

අඩුකලා -

| | | |
|---|---|---|
| පොලිය - ක්‍රෙඩිට් කාඩ් මත (ඉඩ දෙනු නොලැබේ) | | |
| නිවාස ණය මත | 1,000 | |
| ඉදිරියට ගෙන ආ අලාභය 250,000 | | |
| මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් 35% ට යටත්ව (1,050,000x35%) | (250,000) | (251,000) |
| තක්සේරු කළ හැකි ආදායම | | 799,000 |
| බද්දෙන් නිදහස් දීමනාව | 300,000 | |
| අනුමත පුණ්‍යායතන වෙත පරිත්‍යාග | 15,000 | |
| (තක්සේරු කළ හැකි ආදායමෙන් 1/3 හෝ රු.75,000 ට යන දෙකෙන් අඩු මුදලට යටත්ව) | | (315,000) |
| බදු අයකළ හැකි ආදායම | | 484,000 |
| පළමු 300,000 මත 5% බැගින් 15,000 | | |
| ඉතිරි 184,000 මත 10% බැගින් 18,400 | | 33,400 |

රජයේ නිල පඩිනඩිවලට ආරෝපනය කළහැකි බද්ද

$$\frac{\text{ගෙවිය යුතු දළ බද්ද}}{\text{මුළු ව්‍යවස්ථාපිත ආදායම්}} \times \text{රජයේ නිල පඩිනඩි (දිරි දීමනා, ප්‍රසාද දීමනා, ත්‍යාග ආදිය හැර)}$$

$$\frac{33,400}{1,050,000} \times 600,000 \qquad (22,057)$$

ගෙවිය යුතු ශේෂය 11,343

=====

**සටහන : බදු අය වන ආදායම මත ගණන් බලන ලද බද්ද, සේවා නියුක්ති ආදායම (ප්‍රසාද මුදල්, දිරි ගැන්වීමේ ප්‍රදාන, තැගි මුදල්, දඩ මුදල් කොටස් හෝ ඒ හා සමාන වෙනත් ගෙවීම් හැර) මුළු ව්‍යවස්ථාපිත ආදායමට දරනු ලබන අනුපාතයට සමාන අනුපාතයකින් අඩු කොට ගෙවිය යුතු බද්ද ගණනය කොට ඇත.**

**නිදර්ශනය (III)**

පෙරේරා මයා රජයේ වෛද්‍යවරයෙකු වන අතර පෞද්ගලික වෛද්‍ය සේවයේද යෙදී සිටී. 2008.04.01 සිට 2009.03.31 දක්වා ඔහුගේ ආදායම් පහත දැක්වේ.

2008 / 2009 ආදායම

| | රු. | රු. |
|---|---|---|
| රජයේ නිල පඩිනඩි | | 250,000 |
| පෞද්ගලික වෛද්‍ය සේවාවෙන් ලැබෙන ශුද්ධ ආදායම (බදු කටයුතු සඳහා ගලපන ලද) | | 600,000 |
| පොලී ආදායම් (10% බැගින් රඳවා ගැනීමේ බද්ද අඩු කරන ලද) | | 15,000 |
| එකතුව | | 850,000 |

වියදම්

| | |
|---|---|
| වාහන ණය සඳහා ගෙවූ පොලී | 12,000 |
| නිවාස ණය සඳහා ගෙවූ පොලී | 10,000 |

වෛද්‍ය පෙරේරා මයා විසින් තක්සේරු වර්ෂ 2008/2009 සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද පහත දැක්වෙන පරිදි ගණනය කෙරේ.

| | රු. |
|---|---|
| රජයේ නිල පඩිනඩි | 250,000 |
| පෞද්ගලික වෛද්‍ය සේවාවෙන් ලැබෙන ශුද්ධ ආදායම (බදු කටයුතු සඳහා ගලපන ලද) | 600,000 |
| පොලී ආදායම් (රඳවා ගැනීමේ බද්ද අඩු කර ඇති බැවින් අවසන් බද්ද වේ) | -- |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | 8,50,000 |
| අඩුකලා : වාහන ණය මත පොලී ඉඩ නොදේ | -- |
| නිවාස ණය මත පොලී | (10,000) |
| තක්සේරු වන ආදායම | 840,000 |
| අඩුකලා: බදු නිදහස් දීමනාව | (300,000) |
| බදු අයවන ආදායම | 540,000 |

| | | | |
|---|---|---|---|
| පළමු රු.300,000 5% බැගින් | 15,000 | | |
| ඊළඟ රු.200,000 10% බැගින් | 20,000 | | |
| ඉතිරි රු.40,000 15% බැගින් | 6,000 | | 41,000 |

රජයේ නිල පඩිනඩිවලට ආරෝපනය කළ හැකි ප්‍රමාණය

$$\frac{41,000 \times 250,000}{850,000} = 12,059$$

ගෙවිය යුතු ඉතිරි බද්ද 28,941

=====

# 3 වැනි කොටස

# ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම

පළමුව ගෙවිය යුතු දළ ආදායම් බද්ද ගණනය කර එයින් අදාල බදු බැර අඩු කර 2008/2009 තක්සේරු වර්ෂය සඳහා ඔබ විසින් ගෙවිය යුතු බද්ද හෝ ආපසු ගෙවීම ගණනය කරන්න.

## දළ ආදායම් බද්ද ගණනය කිරීම

බදු අය වන ආදායම මත (වාර්තාවේ 410 වැනි කොටුව) දළ බද්ද ගණනය කිරීම සඳහා පහත දැක්වෙන බදු අනුප්‍රමාණයන් පාවිච්චි කරන්න.

### (01). සාමාන්‍ය බදු අනුප්‍රමාණයන්

ඔබගේ බදු අයවන ආදායම ඇතුලත් වන බදු අය වන ආදායම් පරාසය තෝරාගෙන බද්ද ගණනය කරන්න.

| බදු අයවන ආදායම් පරාසය | බදු අයවන ආදායම් පරාසයෙහි පහල ආදායමට සමාන බදු අය වන ආදායමක් මත බද්ද | පරාසයෙහි පහල ආදායම ඉක්මවන බදු අය වන ආදායම් කොටස මත අනු ප්‍රමාණය |
|---|---|---|
| 000,000 - 300,000 | -- | 5% |
| 300,000 - 500,000 | 15,000 | 10% |
| 500,000 - 700,000 | 35,000 | 15% |
| 700,000 - 900,000 | 65,000 | 20% |
| 900,000 - 1100,000 | 105,000 | 25% |
| 1,100,000 - 1,600,000 | 155,000 | 30% |
| 1,600,000 - සහ ඊට වැඩි | 305,000 | 35% |

නිදර්ශණය:

(i) බදු අයවන ආදායම රු.250,000 වේ නම් එය ඇත්තේ පලමු පරාසයේ බැවින් ගෙවිය යුතු බද්ද වනුයේ 250,000 x 5% = 12,500

(ii) බදු අයවන ආදායම රු.510,000 වේ නම් එය ඇත්තේ තෙවන පරාසයේ බැවින් ගෙවිය යුතු බද්ද වනුයේ 35,000+(10,000 x 15% =1500)=36,500

### (2). සමහර සේවා නියුක්ති ආදායම් සඳහා අදාල වන විශේෂ අනුප්‍රමාණයන්

(1) **එකවර ගෙවීම්වලට අදාල අනුප්‍රමාණයන් (සේවා නියුක්තියෙන් ලැබෙන සේවාන්ත ප්‍රතිලාභ)**

පහත සඳහන් සහන බදු අනුප්‍රමාණයන්, ඒකාකාර ක්‍රමයක් මත එක් වතාවක් පමණක් කරන සේවා නියුක්ති ගෙවීම්හි මුළු එකතුව සඳහා අදාල වේ. (කෙසේ වෙතත්, රු.මිලියන 1.8 ක් හෝ පසුගිය තුන් වසර සඳහා මාසික වැටුප් සාමාන්‍ය සහ සේවය කරන ලද පූර්ණ වර්ෂ ගණන යන දෙකෙහි ගුණිතය යන්නෙහි වැඩි අගය ඉක්මවා ගෙවනු ලබන යම් විශ්‍රාම පාරිතෝෂික ප්‍රමාණයක් හැර ඊට වැඩි වන විශ්‍රාම පාරිතෝෂික සාමාන්‍ය අනුක්‍රමික අනු ප්‍රමාණ අනුව බද්දට යටත් කෙරේ.)

සේවා කාලය හෝ දායක මුදල් ගෙවූ කාල පරිච්ඡේදය අවුරුදු 20 ක් හෝ ඊට වැඩි නම් } පළමු රු. 5,000,000 - බදු නොමැත.

හෝ

සේවා කාලය හෝ දායක මුදල් ගෙවූ කාලය අවුරුදු 20 ට අඩු නම් } පළමු රු. 2,000,000 - බදු නොමැත.

ඊළඟ රු. 1,000,000 සඳහා - 5%

ඉතිරිය සඳහා - 10%

සේවා නියුක්තිය අවසන් වීම මත යම් වන්දියක් ඒකාකාරි නොවන ක්‍රමයකට ලබන්නේ නම් එම මුදල සම්බන්ධයෙන් 20% ක උපරිමයට යටත්ව සාමාන්‍ය අනුප්‍රමාණයන් මත බද්ද ගණනය කළ යුතුය.

සේවාන්ත ප්‍රතිලාභ ඇතුලත් කරමින්ද, පසුව ඒකාකාරි ක්‍රමයේ සේවාන්ත ප්‍රතිලාභ ඉවත්කරමින්ද බදු අයකල හැකි ආදායම සඳහා අගයන් 2 ක් ගණනය කර එම අගයන් අතර වෙනස මත අදාල උපලේඛනයේ අනුප්‍රමාණයන් යොදා ගනිමින් සේවාන්ත ප්‍රතිලාභ මත බද්ද ගණනය කරන්න.

***සේවා නියුක්තියෙන් එක්වරක් පමණක් කරන ගෙවීම් මත බද්ද වාර්තාවේ 500 වැනි කොටුවේ සටහන් කරන්න.***

## (03).වෙනත් විශේෂිත බදු අනුප්‍රමාණ

(අ) (i) බදු අය කෙරෙන ආදායමට ඇතුලත් සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය, සමහර ඉදි කිරීම් කටයුතු, සමහර කෘෂිකාර්මික කටයුතු ආදියෙන් ලබන ලාභ (බද්දෙන් නිදහස් නොවේ නම්) සහ සුදුසුකම් ලබන අපනයන ලාභ, 15% නොඉක්මවන අනුප්‍රමාණයෙන් බද්දට යටත් වේ.

(ii) බදු අයකල හැකි ආදායමේ කොටසක් වන ශ්‍රී ලංකාවෙන් පිටතදී ලබන ලාභාංශ, 10% අනුප්‍රමාණයෙන් බද්දට යටත් වේ. කෙසේ වෙතත් 2008.04.01 දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවේ නිර්වාසික සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ වාසික යම් කොටස් හිමියෙකුට ගෙවන ලද යම් ලාභාංශයක් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරයි නම් එම ලාභාංශය බද්දෙන් නිදහස් වේ.

(ආ) ලොතරැයි, ඔට්ටු හෝ සූදු සම්බන්ධයෙන් බදු අනු ප්‍රමාණය 40% කි.

(ඇ) ගුවන් සංතරණ පනත යටතේ බලපත්‍රලත් ගුවන් සමාගමක ගුවන් නියමුවෙකු වශයෙන් සේවයේ නියුතු යම් ශ්‍රී ලාංකික පුරවැසියෙකුගේ බදු අය කල හැකි ආදායමේ **එකී සේවා නියුක්තියෙන් ලද ආදායම** මත ගෙවිය යුතු බද්ද ගණනය කිරීමේදී සාමාන්‍ය බදු අනුප්‍රමාණ භාවිතා කළද එහි උපරිම සීමාව 20% වේ.

## 11. බදු බැර (11 වැනි උපලේඛනය)

*(1) රජයේ සේවා නියුක්ති බදු බැර (11 වැනි උපලේඛනයේ 541 වැනි කොටුව)*

බැර ලැබිය හැක්කේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙහි ඇතුලත් නිල පඩිනඩිවලට (දීරි දීමනා, ප්‍රසාද දීමනා, ත්‍යාග හෝ සමාන ගෙවීමකට හැර) ආරෝපනය කළහැකි බද්දේ ප්‍රමාණයට අදාලව පමණි.

*ද්විත්ව බදුවලින් සහන (11 වැනි උපලේඛනයේ 542 වැනි කොටුව)*

යම් ද්විත්ව බදු සහනයක් ඔබට හිමි වන්නේ නම් ලැබිය යුතු සහනය ගණනය කිරීම සඳහා ඔබේ තක්සේරුකරු විමසන්න. (අඩු කිරීම එවැනි ආදායමක් මත අයකෙරෙන ශ්‍රී ලංකා බද්දට වඩා වැඩි නොවිය යුතුය).

*(2) 10% බැගින් ගෙවන ලද හවුල් ව්‍යාපාර බද්දේ කොටස (11 වැනි උපලේඛනයේ 543 වැනි කොටුව)*

ඔබ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෙකු වන්නේ නම්, ගෙවූ හවුල් ව්‍යාපාරයෙන් 10% හවුල් ව්‍යාපාර බද්දේ කොටස මෙහි ඇතුලත් කරන්න. මෙම කොටස හවුල් ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ කොටස මත බද්දට පමණක් හිලව් කළ හැකිය.

(කෙසේ වුවද, හවුල් ව්‍යාපාරය විසින් ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුව, 10% හවුල් ව්‍යාපාර බද්දට වඩා වැඩි නම් හවුල් ව්‍යාපාර බද්ද අය නොකෙරේ. 10% හවුල් ව්‍යාපාර බද්ද ගෙවූ ආර්ථික සේවා ගාස්තුවට වඩා වැඩි නම් හවුල් ව්‍යාපාර බද්ද වෙනුවෙන් අයවිය යුත්තේ ආර්ථික සේවා ගාස්තුවට වඩා වැඩි වූ හවුල් ව්‍යාපාර බද්දේ අතිරික්තයයි.)

**ගෙවා ඇති හවුල් ව්‍යාපාර බදුවලින් කිසිම කොටසක් ආපසු ගෙවීමට හෝ ඉදිරියට ගෙන යාමට නොහැකි බව කරුණාවෙන් සලකන්න.**

*(3) ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු සඳහා බැර (11 උපලේඛනයේ 546 සිට 560 දක්වා කොටු)*

මෙම තක්සේරු වර්ෂයේ යම් කාර්තුවක් සඳහා ඔබ විසින් ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුව (ඔබ හවුල්කරුවෙකු වන හවුල් ව්‍යාපාරයක් විසින් බෙදා වෙන් කල යම් ආර්ථික සේවා ගාස්තු කොටසක්ද ඇතුළුව) ඔබ විසින් මෙම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දට හිලව් කල හැකිය.

උපලේඛනයේ

546 කොටුව - කලින් වර්ෂවලින් ඉදිරියට ගෙන ආ යම් ශේෂයක් වේ නම් මෙම කොටුවේ සඳහන් කරන්න.

547 සිට 550 දක්වා කොටු - ඔබ විසින් ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු, ත්‍රෛයිමාසික ගෙවීම්. 1 වැනි, 2 වැනි, 3 වැනි සහ 4 වැනි වශයෙන් පිළිවෙලින් 547,548,549 සහ 550 කොටුවල ඇතුලත් කරන්න.

555 කොටුව - 546 සිට 550 දක්වා කොටුවල මුළු එකතුව 555 කොටුවෙහි සටහන් කරන්න.

556 කොටුව - යම් හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුවේ ඔබට හිමි යම් කොටසක් වේ නම් 556 කොටුවේ සටහන් කරන්න.

558 කොටුව - 555 සහ 556 කොටුවල මුළු මුදල 558 කොටුවේ ඇතුලත් කරන්න.

559 කොටුව - ගෙවිය යුතු දළ බද්දෙන් (එනම් වාර්තාවේ 530 කොටුවේ මුදල) 11 වැනි උපලේඛනයේ 541,542 සහ 543 කොටුවල මුදල් ප්‍රමාණයන් අඩු කිරීමෙන් පසුව 558 කොටුවේ සඳහන් ප්‍රමාණය ඔබ විසින් ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණයට වඩා වැඩි නම් එම සංඛ්‍යා දෙකේ වෙනස (එනම් 558 කොටුවේ සංඛ්‍යාව සහ 541,542 සහ 543 යන කොටුවල සඳහන් මුදල් ප්‍රමාණයන් අඩු කිරීමෙන් පසුව අතිරික්ත ප්‍රමාණය) 559

කොටුවෙහි සඳහන් කරන්න. එය අඩුකිරීම් කටයුතු සඳහා ඊළඟ තක්සේරු වර්ෂයට ඉදිරියට ගෙන යන ආර්ථික සේවා ගාස්තුවේ මුදල් ප්‍රමාණයයි.

560 කොටුව - 558 කොටුවේ ප්‍රමාණය හෝ වාර්තාවේ 530 කොටුවේ සඳහන් ප්‍රමාණයෙන් 541,542 සහ 543 යන කොටුවල මුදල් ප්‍රමාණයන් අඩු කිරීමෙන් පසුව ගෙවිය යුතු දළ ආදායම් බද්ද යන දෙකින් අඩු මුදල සඳහන් කරන්න.

යම් වර්ෂයක් තුලදී ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුවේ යම් අඩු නොකල ශේෂයක් ඉදිරියට ගෙන යා හැක්කේ ඊළඟ තක්සේරු වර්ෂ සතර (4) දක්වා පමණක් බැවින් අඩු

කිරීම් සඳහා (ගෙවන ලද) ආර්ථික සේවා ගාස්තුව බැරක් ලෙස ඔබ විසින් ඉල්ලා සිටින විට (11 උප ලේඛනයේ 560 කොටුව) කලින් වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ ආර්ථික සේවා ගාස්තුවේ යම් ශේෂයක් පළමුව අඩු කරන්න.

(4) *උපයන විට ගෙවීම් ක්‍රමය යටතේ අඩු කරන ලද බදු (11 උපලේඛනයේ 562 කොටුව)*

උපයන විට ගෙවීම්වල මුළු අඩු කිරීම් සඳහන් කරන්න. කරුණාකර ඔබේ සේවා යෝජකයා විසින් නිකුත් කරන ලද උ.වි.ගෙ. T - 10 සහතික අමුණන්න.

*(5) නිශ්චිත ගාස්තු මත අඩු කරන ලද රඳවා ගැනීමේ බද්ද (11 උපලේඛනයේ 564 කොටුව)*

*(6) පදිංචි කාර්යය සඳහා නොවූ ස්ථානවලට අදාල කුලී ආදායම මත අඩු කර ගන්නා ලද රඳවා ගැනීමේ බද්ද (11 උපලේඛනයේ 566 කොටුව)*

(7) *1 වැනි, 2 වැනි, 3 වැනි, 4 වැනි වාරික සහ අවසාන ගෙවීම් වශයෙන් ගෙවූ ආදායම් බදු (11 උපලේඛනයේ 570 සිට 574 දක්වා කොටු)* ත්‍රෛමාසික ආදායම් බදු ගෙවීම් සඳහන් කරන්න. (ගෙවීම් පත්‍රිකාවල පිටපත් අමුණන්න)

*(8) ස්ව තක්සේරු බදු වාරික කලින් ගෙවීම වෙනුවෙන් වට්ටම් (11 උපලේඛනයේ 575 කොටුව)*

නියමිත දිනට එක් මසකට කලින් ඔබ ත්‍රෛයිමාසික ගෙවීම් කර ඇත්නම් ඔබේ ත්‍රෛමාසික ස්ව තක්සේරු බදු ගෙවීම් මත (වත්මන් වර්ෂයේ බදු බැඳියාව මත පදනම් වූ) 10% ක වට්ටමකට ඔබට හිමිකම් ඇත.

<u>නිදර්ශනය - 1</u>

2007/2008 තක්සේරු වර්ෂය සඳහා ඔබේ ආදායම් බදු බැඳියාව රු.100,000/- වූයේ යයිද 2008/2009 තක්සේරු වර්ෂය සඳහා එය රු.150,000/- ක් වූයේ යයිද, පහත දැක්වෙන ආකාරයට ඔබ ස්ව තක්සේරු බදු නියමිත දිනයන්ට කලින් ගෙවා ඇතැයිද උපකල්පනය කරන්න.

| | |
|---|---|
| 2008/2009 තක්සේරු වර්ෂය සඳහා බදු බැඳියාව | - රු.150,000/- |
| අඩු කලා:- | |
| ස්ව තක්සේරු ගෙවීම් මත බදු බැර (11 උපලේඛනයේ 570 සිට 573 දක්වා කොටු) | |
| 1 වැනි වාරිකය - 2008 ජූලි 15 දින හෝ ඉන් පෙර (100,000/4) අඩු කලා 10% | - රු.22,500/- |
| 2 වැනි වාරිකය - 2008 ඔක්තෝබර් 15 දින හෝ ඉන් පෙර (100,000/4) අඩු කලා 10% | - රු.22,500/- |
| 3 වැනි වාරිකය - 2009 ජනවාරි 15 දින හෝ ඉන් පෙර (100,000/4) අඩු කලා 10% | - රු.22,500/- |
| 4 වැනි වාරිකය - 2009 අප්‍රේල් 15 දින හෝ ඉන් පෙර (100,000/4) අඩු කලා 10% | - රු.22,500/- |
| ත්‍රෛමාසික ස්ව තක්සේරු ගෙවීම්වල එකතුව | - රු.90,000/- |

මුළු වට්ටම් (11 උපලේඛනයේ 575 කොටුව) - රු.10,000/-

රු.100,000/-

| | |
|---|---|
| අවසාන ගෙවීම් වශයෙන් 2009 සැප්තැම්බර් 30 දින හෝ ඉන් පෙර ගෙවිය යුතු ඉතිරි බද්ද (11 උපලේඛනයේ 574 කොටුව) | - රු. 50,000/- |

වට්ටම වත්මන් වර්ෂයේ බදු බැදියාවෙන් 10% කට සීමා වේ.
(එනම් 150,000 x 10%) = 15000)

## නිදර්ශනය - 2

2007/2008 තක්සේරු වර්ෂය සඳහා ඔබේ ආදායම් බදු බැදියාව රු.100,000 ක් වූයේ යයිද 2008/2009 තක්සේරු වර්ෂය සඳහා එය රු.80,000/- ක් වූයේ යයිද, පහත දැක්වෙන ආකාරයට ස්ව තක්සේරු බදු ඔබ නියමිත දිනට කලින් ගෙවා ඇතැයිද උපකල්පනය කරන්න.

| | | |
|---|---|---|
| 2008/2009 තක්සේරු වර්ෂය සඳහා බදු බැදියාව | | රු. 80,000/- |
| අඩුකලා:- ස්ව තක්සේරු ගෙවීම් මත බදු බැර (11 උපලේඛනයේ 570 සිට 573 දක්වා කොටු) | | |
| 1 වැනි වාරිකය - 2008 ජූලි 15 දින හෝ ඉන් පෙර (100,000/4) අඩු කලා 10% | - රු.22500/- | |
| 2 වැනි වාරිකය - 2008 ඔක්තෝබර් 15 දින හෝ ඉන් පෙර (100,000/4) අඩු කලා 10% | - රු.22500/- | |
| 3 වැනි වාරිකය - 2009 ජනවාරි 15 දින හෝ ඉන් පෙර (100,000/4) අඩු කලා 10% | - රු.22500/- | |
| 4 වැනි වාරිකය - 2009 අප්‍රේල් 15 දින හෝ ඉන් පෙර (100,000/4) අඩු කලා 10% | - රු.22500/- | |
| ත්‍රෛයිමාසික ස්ව තක්සේරු ගෙවීම්වල එකතුව | රු.90,000/- | |
| මුළු වට්ටම් (11 උපලේඛනයේ 575 කොටුව) | රු.8000* | (98000) |
| 2008/2009 තක්සේරු වර්ෂය සඳහා ඔබට ලැබිය යුතු ආපසු ගෙවීම | | රු. 18,000/- |

* වට්ටම වත්මන් වර්ෂයේ බදු බැදියාවෙන් 10% කට සීමා වේ. (එනම් 80,000 x10%) 1 වැනි, 2 වැනි, 3 වැනි සහ 4 වැනි ත්‍රෛමාසික ස්ව තක්සේරු බදු ගෙවීම්වල ගෙවීම් දිනය පිළිවෙලින් D1,D2,D3 සහ D4 කොටුවල සඳහන් කරන්න.

(10) අවසාන බද්දක් වශයෙන් වන යම් රඳවා ගැනීමේ බද්දක් හැර ලාභාංශ, පොලිය හෝ වෙනත් ලැබීම් මත ප්‍රභවයේදී ගෙවූ වෙනත් යම් ආදායම් බද්දක් (යම් රඳවා ගැනීමේ බද්දක්) වෙතොත් එහි ස්වභාවය සඳහන් කර සනාථ කරන ලියකියවිලිද ඉදිරිපත් කරන්න. (11 වැනි උපලේඛනයේ 578 කොටුව)

**උපලේඛන 11 හි 580 වැනි කොටුව තුලවූ සම්පූර්ණ එකතුව වාර්තාවේ 540 වැනි කොටුවේ සඳහන් කරන්න.**

# 4 වැනි කොටස

**මුළු ව්‍යවස්ථාපිත ආදායමෙහි කොටසක් නොවන ආදායම් (ආදායම් බද්දෙන් නිදහස් ආදායම් ඇතුළුව)**

**මුළු ව්‍යවස්ථාපිත ආදායමෙහි ඇතුළත් නොවන ආදායම්**

අවසන් බදු ලෙස ප්‍රභවයේදී 10% ක හෝ ඊට අඩු ප්‍රතිශතයකින් රඳවා ගැනීමේ බද්ද අඩු කර ඇති පොලී, ලාභාංශ, තිළිණ, දඩ මුදල්, ලොතරැයි දිනුම් පිළිබඳ විස්තර හා විකුණුම් මිල මත මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් අඩු කළ 2.5% ක රඳවා ගැනීමේ බද්ද පිළිබඳ විස්තර මේ යටතේ සඳහන් කරන්න.

**ආදායම් බද්දෙන් නිදහස් ආදායම්**

මේ යටතේ බද්දෙන් නිදහස් ආදායම පිළිබඳ විස්තර සපයන්න.

එනම්, 2009.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්තාවේ 100 වැනි කොටුවේ සිට 160 දක්වා කොටුවල සඳහන් යම් ආදායම් ප්‍රභවයකින් ලැබූ බද්දෙන් නිදහස් ආදායමය.

## 5 වැනි කොටස - ප්‍රකාශය

ඔබගේ  කලත්‍රයා සහ දරුවන් පිළිබඳ විස්තර, ඔබ හඳුනාගැනීමේ විස්තර, ලිපිනයන් සහ ඇමතිය හැකි දුරකථන අංක සඳහන් කර ඔබගේ අත්සන යොදන්න.

## <u>2009.03.31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය</u>

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 106 (6) වගන්තිය ප්‍රකාරව, තක්සේරු වර්ෂයේ අවසාන දිනට ඔබගේ (ශ්‍රී ලංකාවේ හෝ පිටරට පිහිටි) සෑම වත්කමක්ම  සහ බැරකමක් ඔබ විසින් ප්‍රකාශ කළ යුතුය.

ඒ අනුව, වාර්තාව සමග සපයා ඇති ***"වත්කම් හා බැරකම් ප්‍රකාශය"*** ආකෘති පත්‍රයද සම්පූර්ණ කර වාර්තාව සමග සැපයිය යුතුය.

(අ) නිශ්චල දේපල: 2009.03.31 දිනට ඔබගේ (ශ්‍රී ලංකාවේ හෝ පිටරට පිහිටි) සියළු නිශ්චල දේපල වටිනාකම් සමග ප්‍රකාශ කරන්න.

(ආ) චංචල දේපල: 2009.03.31 දිනට ඔබ සතු සියළු චංචල දේපල (ශ්‍රී ලංකාවේ හෝ පිටරට පිහිටි) එනම්, මෝටර් රථ, බැංකු තැන්පත්, කොටස්/ව්‍යාපාර වස්තු/සුරැකුම් පත්, අත ඇති මුදල්, ණයට දුන් මුදල්  හෝ ලැබිය යුතු මුදල්, රත්තරං, රිදී, මැණික් හා ස්වර්ණාභරණ ආදිය ඒවායේ  වටිනාකම සමග ප්‍රකාශ කරන්න.

(ඇ) වෙනත් යම් වත්කම් අත්කර ගැනීම (ත්‍යාග ලැබීම්ද ඇතුළුව) :
අත්පත් කර ගත් වෙනත් සියළු වත්කම් සම්පූර්ණ විස්තර සපයමින් ප්‍රකාශ කරන්න.

(ඈ) කොටස් ඇතුළු යම් වත්කමක් බැහැර කිරීම:
2008.04.01 සිට 2009.03.31 දක්වා කාලය තුල බැහැර කරන ලද වත්කම් පිළිබඳ සියළු විස්තර ප්‍රකාශ කරන්න.

(ඉ) ව්‍යාපාරයක කොටසක් ලෙස තිබෙන දේපල:
2009.03.31  දිනට ව්‍යාපාරයක කොටසක් ලෙස ඔබට තිබෙන යම් දේපලක වටිනාකම එනම් ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂයන් ප්‍රකාශ කරන්න. (අදාල අවස්ථාවන්හි දී ශේෂ පත්‍ර අමුණන්න)